1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 මෙම වාර්තාවේ 1.2 (ආ), (ඇ), (ඒ) හා (ඕ) ඡේදවල දැක්වෙන නිරීක්ෂණ හැර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරනලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම් තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති රීති හා විධිවිධානවලට යොමුව	නිරීක්ෂණ
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 2.1 හා 2.2 සිට 2.6 දක්වා වූ වගන්ති.	කාර්ය මණ්ඩලයේ සෑම සේවයකම හා සෑම ශ්‍රේණියකම තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම්, තනතුරෙහි වැටුප් පරිමාණය, වයස් සීමාව සහ අදාළ අනෙකුත් විස්තර ඇතුළත්කර බඳවා ගැනීමේ පටිපාටි පිළියෙල කර ආයතන සංග්‍රහයේ දක්වා ඇති ක්‍රියා පිළිවෙල අනුගමනය කරමින් එකී පටිපාටි සඳහා අදාළ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතු වුවද, 2022 දෙසැම්බර් 15 දින වන විටත් බඳවා ගැනීම් පටිපාටි පිළියෙල කර අනුමැතිය ලබාගෙන නොතිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය, මුදල් රෙගුලාසි 395 (ආ) සහ (ඇ) ඡේද	බැංකු ගිණුම් සඳහා එක් එක් මාසය අවසානයේ ඇති ගනුදෙනු තත්ත්වය සම්බන්ධයෙන් ඊළඟ මාසයේ 15 දිනට පෙර බැංකු සැසඳුමක් පිළියෙල කළ යුතු වුවත් රෝහලේ ජංගම ගිණුම් අංක 227982 ගිණුමට අදාලව බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.
(ඇ) 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනතේ 5 වගන්තිය හා 1992 අංක 62 දරන සංශෝධිත පාරිතෝෂික ගෙවීමේ පනත	නියමිත දිනයන් තුළ පාරිතෝෂික නොගෙවීම හේතුවෙන් 2021 ජූනි 18 දින සේවයෙන් ඉල්ලා අස්වී තිබුණු නිලධාරිනියක් වෙත අධිභාර ලෙස රු.127,062 ක නිශ්කාර්ය වියදමක් දරා තිබුණි.
(ඇ) 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය.	මූල්‍ය වර්ෂය අවසන් වීමෙන් දින 60ක් ඇතුළත විගණකාධිපති වෙත අනුමත මූල්‍ය ප්‍රකාශන හා වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් ඉදිරිපත් කළ යුතු වුවත්, 2021 මූල්‍ය වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන මාස 08 කට වඩා වැඩි කාල ප්‍රමාදයක් සහිතව 2022 නොවැම්බර් 08 දින ඉදිරිපත් කර තිබුණි.
(ඉ) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ 2006 මැයි 10 දිනැති පොදු චක්‍රලේඛ ලිපි අංක Q 2 - 84/2006	රසායනාගාර කාර්යමණ්ඩලය විසින් රාත්‍රී කාලය තුළ සිදුකරනු ලබන රසායනාගාර පරීක්ෂණ සඳහා කැලි පදනම මත දීමනා ගෙවීමේදී චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවන ලෙස රාත්‍රී කාලයේ සේවයේ යෙදෙන වෛද්‍ය රසායනාගාර තාක්ෂණික නිලධාරීන් විසින් ඉල්ලුම් කරනු ලබන සියලුම පරීක්ෂණ සඳහා කැලි පදනම මත ගෙවීම් කිරීම හේතුවෙන් 2021 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ විවිධ රසායනාගාර පරීක්ෂණ 154,687ක් සඳහා රු.මිලියන 3.48 දීමනා වැඩිපුර ගෙවා තිබුණි.
(ඊ) 2016 ඔක්තෝබර් 10 දිනැති අංක DMS/1758-Vol.1 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපිය.	අනුමත කාර්ය මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කරන යෝජනා සකස්කර ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව වෙත යොමුකර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු වුවද, 2022 දෙසැම්බර් 31 දින වන විටත් ඒ අනුව කටයුතුකර නොතිබුණි.

(උ) 2019 දෙසැම්බර් 17 දිනැති අංක PFD 08/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය — 2020 වර්ෂයේ සිට විද්‍යුත් ප්‍රසම්පාදන ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වුවත් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඌ) 2020 ඔක්තෝබර් 26 දිනැති අංක 02/2020 හා 2020 පෙබරවාරි 21 දිනැති අංක 01/2020 දරන කළමණාකරණ සේවා චක්‍රලේඛ — බඳවාගැනීමේ පටිපාටි පිළියෙල කර අදාල පාර්ශව වෙතින් අනුමැතිය ලබාගෙන ඇත්නම් පමණක් අනුමත තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු නොවන නමුත් රෝහල් කාර්යමණ්ඩලය සඳහා බඳවා ගැනීමේ පටිපාටි පිළියෙල කර නොතිබියදී කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව 2020 හා 2021 වර්ෂයන් තුළ සේවක කාණ්ඩ 8 ක් සඳහා තාවකාලික, කොන්ත්‍රාත්, අනියම් හා ස්ථිර පදනම් මත නිලධාරීන් 237 ක් බඳවාගෙන තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාව අනුව මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) රෝහල් කාර්යමණ්ඩලයට අදාල බඳවා ගැනීමේ පටිපාටි (SOR) පිළියෙල කිරීමට සුදුසු උපදේශකවරයෙකුගේ සේවාව ලබා ගැනීමේදී උපදේශකවරු තෝරා ගැනීමේ හා සේවා නියුක්ත කිරීමේ මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4, 3.5, 4.2 හා 6.6.4 මාර්ගෝපදේශ අනුගමනය කර නොතිබුණි. තෝරාගෙන තිබුණු උපදේශකවරයා විසින් ඉදිරිපත් කර තිබූ කෙටුම්පත් වාර්තාව සඳහා රෝහල් කාර්යමණ්ඩලයේ හා වෘතීය සංගම්වල එකඟතාවය නොමැතිවීම හේතුවෙන් 2023 වර්ෂය වන විටත් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කළමණාකරණ මණ්ඩලයට නොහැකි වී තිබුණි.

(ආ) 2021 සැප්තැම්බර් 16 දින රු.මිලියන 2.08 ක් වැය කරමින් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල විසින් ABP Monitoring System එකක් ප්‍රසම්පාදනය කර තිබුණු අතර මෙම ප්‍රසම්පාදනයට ලංසු ඉදිරිපත් කර තිබුණු ලංසුකරුවන් වෛද්‍ය උපකරණ සැපයීමට අදාලව ජාතික ඖෂධ හා නියාමන අධිකාරියේ ලියාපදිංචිය ඉදිරිපත් කර නොතිබුණි. තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය අනුව ඉහත ලියාපදිංචිය පසුව ලබාගැනීමේ කොන්දේසියට යටත්ව වැඩිම මිල ලංසුව සඳහා 2021 මැයි 20 දින ප්‍රසම්පාදනය පිරිනමා තිබුණද, ඖෂධ හා වෛද්‍ය උපකරණ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.1 හා 2.2 මාර්ගෝපදේශ ප්‍රකාරව එම ලියාපදිංචිය 2022 මාර්තු 15 විගණිත දින වනවිටත් ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) රෝහලේ Harmonic Hand Piece 08ක් මිලදී ගැනීම සඳහා අදාල සැපයුම්කරු එක් උපාංගයක් රු.933,900 බැගින් උපාංග 8 ක් සඳහා රු.මිලියන 7.47 ක ලංසුවක් ඉදිරිපත් කර තිබුණි. 2020 නොවැම්බර් 17 දින පවත්වන ලද තාක්ෂණික ඇගයීම් කමිටුවේදී මෙම උපාංගයෙන් ඒකක 02 ක් පමණක් මිලදී ගැනීමටත් 2019 වර්ෂයේ මිල ගණන් සැලකීමෙන් මෙම උපාංගය රු.868,900 කට මිලදී ගැනීමටත් නිර්දේශ කර තිබුණද ප්‍රසම්පාදන කමිටුව එම නිර්දේශ නොසලකා කටයුතු කර තිබුණි. ටෙන්ඩරය ඉදිරිපත් කිරීමේදී දින 3 ත් 5 ත් අතර සැපයිය හැකි බව ටෙන්ඩර්කරු දක්වා තිබුණු අතර ටෙන්ඩර් කොන්දේසි පරිදි මෙම ඇණවුම සති 08ත් 10 ත් අතර කාලයක් තුළ සම්පූර්ණ කළ යුතු වුවත් අදාල උපාංග අතුරින් 03 ක් පමණක් නියමිත කාලපරිච්ඡේදය තුළදී ලැබී තිබුණි. ඉතිරි උපාංග 03 ක් සති 05 සිට සති 54 අතර කාලයක් ප්‍රමාද වී තිබුණද ටෙන්ඩර් කොන්දේසි 26.1 පරිදි අයකළ යුතු රු.280,170 ක ප්‍රමාද ගාස්තුවක් අයකර නොතිබුණි. එසේම ටෙන්ඩර් කොන්දේසි 14.5 පරිදි ටෙන්ඩරය සම්පූර්ණ වනතුරු ටෙන්ඩරයේ ඉදිරිපත් කළ මිල ගණන් වෙනස් කළ නොහැකි වුවද එම කොන්දේසිවලට පටහැනිව මෙම ටෙන්ඩරයේ එක් වෛද්‍ය උපාංගයක් ටෙන්ඩරයේ සඳහන් මිලට වඩා රු.644,391 ක් වැඩි මිලකට එනම් රු.මිලියන 1.58 ක මිලකට ටෙන්ඩරය සම්පූර්ණ කළ යුතු කාලයට වඩා සති 81ක් ඉක්මවීමෙන් සපයා තිබුණු අතර ටෙන්ඩර් කොන්දේසි ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අයකිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2007 ඖෂධ හා වෛද්‍ය උපාංග ප්‍රසම්පාදනය සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 මාර්ගෝපදේශය අනුව හදිසි ප්‍රසම්පාදන අවස්ථාවලදී හැර අනෙකුත් ප්‍රසම්පාදන අවස්ථාවලදී අදාල තාක්ෂණික කමිටුවට සෞඛ්‍ය අමාත්‍යාංශයේ නියෝජිතයෙක් (අධ්‍යක්ෂ තරාතිරමට පහල නොවන), රාජ්‍ය ඖෂධ සංස්ථාවේ නියෝජිතයෙක් (අධ්‍යක්ෂ තරාතිරමට පහල නොවන), අවම වශයෙන් අදාල ක්ෂේත්‍රයේ විශේෂඥ වෛද්‍යවරු දෙදෙනෙක් හා භාණ්ඩාගාර නියෝජිතයෙක් වශයෙන් සාමාජිකයින් පත්කළ යුතු වුවත් නියැදි පරීක්ෂාවට අනුව අවස්ථා 05 කදී එකතුව රු.මිලියන 50.82 ක් වූ ඖෂධ හා වෛද්‍ය උපාංග ප්‍රසම්පාදනයේදී නිර්දේශිත නියෝජිතයින් තාක්ෂණික කමිටුවට පත් කිරීමට කටයුතු කර නොතිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) 2016 වර්ෂයේදී රජයේ ප්‍රාග්ධන ප්‍රතිපාදන යටතේ රෝහලේ පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීමට සැලසුම් කර තිබුණු අතර 2017 නොවැම්බර් 22 දින රු.මිලියන 154.56 ක මුදලකට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය විය.

(i) 2020 දෙසැම්බර් 30 දිනෙන් පසුව රෝහල විසින් වරින් වර පෙන්වා දෙන ලද අඩුපාඩු සකස් කිරීමෙන් අනතුරුව ගොඩනැගිල්ලෙහි සියලුම කටයුතු සම්පූර්ණ කළ බව, 2021 මැයි 18 දින සිට 2021 දෙසැම්බර් 14 දින දක්වා අවස්ථා කිහිපයකදීම උපදේශක ආයතනය විසින් රෝහල වෙත දැනුම් දී තිබුණි. 2022 මාර්තු 18 දින ගොඩනැගිල්ල භාරගැනීම රෝහල විසින් සිදු කර තිබුණ ද 2023 පෙබරවාරි මාසය වන විටත් පරිපාලන ගොඩනැගිල්ල අදාල අරමුණට භාවිතා නොකර නිශ්කාර්යව පැවතුණි.

(ii) ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ සහතික කිරීම් පරිදි මෙම කොන්ත්‍රාත්තුවේ වියදම රු.මිලියන 168.44 ක් වී තිබුණු අතර කොන්ත්‍රාත්තුවේ මිල විවලනය වූ රු.මිලියන 13.88 ක ප්‍රමාණය කොන්ත්‍රාත් පිරිවැයෙන් සියයට 8.98 ක් ලෙස ගණනයේදී ගොඩනැගිල්ලේ මූලික ඇස්තමේන්තුවල සඳහන් ශ්‍රවණාගාරය වායුසමීකරණය නොකිරීම, ශ්‍රවණාගාරයේ බිම ටයිල් ඇතිරීම සිදු නොකිරීම යන කාර්යයන් ඉටුනොවීම පිළිබඳව සැලකිල්ලට ගෙන නොතිබුණි.

(iii) 2020 ඔක්තෝබර් 21 දිනැති අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු තීරණයට අනුව කොන්ත්‍රාත් මිල විවලනයට 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.4 ප්‍රකාරව අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ) රෝහලේ වැඩහල සහ උද්‍යාන පවිත්‍ර කිරීමේ කාර්යමණ්ඩලය සඳහා කාර්යාල පවත්වා ගෙන යාම සඳහා තෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවෙකු වෙත රු.මිලියන 87.02 ක (වැට් රහිත) මුදලකට 2016 නොවැම්බර් 09 දින කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය විය.

(i) ගොඩනැගිල්ල ඉදිකිරීමට අවශ්‍ය උපදේශන සේවාව ලබාගැනීමේදී ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය අනුගමනය නොකර අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදි මධ්‍යම ඉංජිනේරු කාර්යාංශය තෝරා ගෙන තිබුණි. කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 8 ක් හෙවත් රු.මිලියන 6.96 ක් උපදේශන සේවා සඳහා ගෙවීමට එකඟවී තිබුණු අතර එම අගය රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට සාපේක්ෂව රු.මිලියන 3.48 කින් හා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට සාපේක්ෂව රු.මිලියන 2.61 කින් වැඩි අගයක් ගෙන තිබුණු බව නිරීක්ෂණය විය.

(ii) ICTAD ආයතනය විසින් නිකුත් කළ ඉදිකිරීම් ටෙන්ඩර් පිළිබඳ සම්මත ලංසු ලියවිලි අනුව ප්‍රමාද ගාස්තු වශයෙන් මුළු කොන්ත්‍රාත් පිරිවැයෙන් දිනකට 0.05ක් හා උපරිමය සියයට 10ක් දක්වා අය කළ හැකි වුවද, කොන්ත්‍රාත් ගිවිසුමට එය සියයට 0.05 ක් හා උපරිමය සියයට 5ක් වශයෙන් ඇතුළත්කර තිබීම හේතුවෙන් රු.මිලියන 4.35 ක ප්‍රමාද ගාස්තුවක් රෝහලට අහිමිවී තිබුණි.

(iii) ගොඩනැගිල්ල ඉදිකිරීම ආරම්භයේදී වැඩහල පැවති ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීම හේතුවෙන් මසකට රු.257,000 ක මුදලකට කන්ටේනර් 12ක් කුලියට ගෙන තිබුණි. ගිවිසුම් ප්‍රකාරව 2018 අප්‍රේල් මාසය වනවිට ඉදිකිරීම් කටයුතු අවසන් නොකිරීම හේතුවෙන් 2022 සැප්තැම්බර් 30 දිනට මාස 52 ක් වෙනුවෙන් රු.මිලියන 13.36 ක අතිරේක කුලී වියදමක් දැරීමට සිදුවී තිබුණි. කොන්ත්‍රාත්කරුගේ මූල්‍ය හැකියාව පිළිබඳව පරීක්ෂා කිරීමකින් තොරව කොන්ත්‍රාත්කරු තෝරා ගෙන තිබුණු බවද නිරීක්ෂණය විය.

(ඇ) රෝහලේ සම්පත් යොදාගෙන රාජකාරී වේලාවෙන් බැහැරව කරන පෞද්ගලික ප්‍රතිකාර සම්බන්ධයෙන් විශේෂඥ වෛද්‍යවරුන්ගේ අභිමතය පරිදි රෝගීන්ගෙන් වෘත්තීය ගාස්තු අයකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) රෝහලේ සම්පත් යොදාගෙන රාජකාරී වේලාවෙන් පරිභාහිරව කරන ශල්‍යකර්ම හා පරීක්ෂණ සඳහා සම්මත ප්‍රමිතියකින් හෝ නිශ්චිත ප්‍රතිපත්තියකින් තොරව විශේෂඥ වෛද්‍යවරුන්ගේ අභිමතය පරිදි අයකරන ගාස්තු තීරණය කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුලදී සිදු කරන ලද ශල්‍යකර්ම හා පරීක්ෂණ වෙනුවෙන් වෘත්තීය ගාස්තු ලෙස රු.1,000 සිට රු.120,000 දක්වා වූ පරාසයක මුදල් අයකර තිබුණි.

(ii) 1984 ජූලි 18 දිනැති අංක අමප/1984/335(2) දරන අමාත්‍ය මණ්ඩල තීරණය සහ 2000 නොවැම්බර් 15 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ප්‍රකාරව සාමාන්‍ය රාජකාරී වෙලාව තුළ ගෙවන වාට්ටුවල රෝගීන් සඳහා සිදුකරන ශල්‍යකර්ම වෙනුවෙන් වෘත්තීය ගාස්තු අය කළ නොහැකි වුවද, සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවට අනුව 2021 වර්ෂයේ අවස්ථා 14 කදී සාමාන්‍ය රාජකාරී වෙලාව තුළ සිදුකර තිබුණු ශල්‍යකර්ම වෙනුවෙන් රු.මිලියන 2.33 ක් වෘත්තීය ගාස්තු ලෙස අය කර තිබුණි. මේ සම්බන්ධයෙන් හෘද සැත්කම් ශල්‍යාගාරයේ (CTOT) ශල්‍යාගාර ලේඛන පරීක්ෂාවේදී රෝහල් අධ්‍යක්ෂකගේ අනුමැතිය මත සාමාන්‍ය කාලය තුළ ශල්‍යාගාරය භාවිතා කර තිබුණු අතර එම ලේඛනයේ ශල්‍යකර්මය සිදු කළ වේලාව දක්වා නොතිබුණු අවස්ථාද විය.

(iii) විශේෂඥ වෛද්‍යවරුන් සිය රාජකාරී වේලාවෙන් පසු සිදුකරනු ලබන ශල්‍යකර්ම හා පරීක්ෂණ සඳහා මහාරෝගාශාලා මණ්ඩලය විසින් මාසිකව රු.581,418 ක් පමණ පොදුකාර්ය පිරිවැය ලෙස වැය කරන බව හඳුනාගෙන තිබුණද 2021 වර්ෂය තුළදී කාර්යමණ්ඩලය වෙත ගෙවා තිබුණු මුළු වෘත්තීය ගාස්තු රු.මිලියන 388 කින් මණ්ඩලයේ ආදායමට බැරකර තිබුණු මුළු සේවා ගාස්තුව රු.583,035 ක් පමණක් විය. සේවා ගාස්තුව වැඩි කිරීම සම්බන්ධයෙන් 2019 සැප්තැම්බර් 25 දින අධ්‍යක්ෂ මණ්ඩලයට යෝජනා ඉදිරිපත් කර තිබුණු නමුත්, සත්‍ය වශයෙන් වැයකරන පොදුකාර්ය පිරිවැයට සාපේක්ෂව අය කරන සේවා ගාස්තුව වැඩිකර ගැනීමට මෙතෙක් අපොහොසත්වී තිබුණි. ඒ අනුව 1999 වර්ෂයේ සිට ක්‍රියාත්මකව පවත්නා වෘත්තීය ගාස්තුවෙන් සියයට 0.15 ක සේවා ගාස්තුවක් පමණක් අයකර ගැනීමේ ක්‍රමවේදය සමාලෝචිත වර්ෂය දක්වා පවත්වාගෙන තිබුණද කාලානුරූපීව අවශ්‍ය සංශෝධනයන් කිරීමට රෝහල් පාලනාධිකාරිය කටයුතු කර නොතිබුණි.

(iv) අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත සහායක වෛද්‍ය හා අනෙකුත් කාර්යමණ්ඩලය සඳහා 2021 වර්ෂයේදී වෘත්තීය ගාස්තු රු.මිලියන 76.91 ක් ගෙවා තිබුණි.

(v) රෝහල් කාර්යමණ්ඩලයට අයත් නොවන බාහිර වෛද්‍යවරුන් 04 දෙනෙකු විසින් 2021 වර්ෂය තුළදී රෝහල් සම්පත් භාවිතා කරමින් ශල්‍යකර්ම සිදු කර තිබුණු අතර මෙම වෛද්‍යවරුන් විසින් 2021 වර්ෂය තුළදී රු.මිලියන 6.59 ක් වෘත්තීය ගාස්තු ලෙස රෝගීන්ගෙන් අය කර තිබුණි. එම මුදලින් රෝහල වෙත සියයට 0.15 ක සේවා ගාස්තුවක් පමණක් අයකර තිබුණි. වෛද්‍යවරු නිදෙනෙකු පෞද්ගලික සේවයේ යෙදීමට කළමණාකරණ මණ්ඩල අනුමැතියක් ලබා නොතිබුණු අතර වෛද්‍යවරුන් රෝහල තුළ පෞද්ගලික සේවයේ යෙදවීමට හා වෘත්තීය ගාස්තු අයකිරීමට අදාළ අනුමැතීන් විගණනය සඳහා ඉදිරිපත්

නොකෙරුණි. එම වෛද්‍යවරුන් සමඟ ගිවිසුමකට එළඹී නොතිබීම තුළ රෝගියාගේ වගකීම රෝහලට පැවරෙන බව නිරීක්ෂණය විය.

(vi) විශේෂඥ වෛද්‍යවරුන් හා අනෙකුත් සහායක කාර්යමණ්ඩලය වෙත ආපසු ගෙවා තිබුණු වෘත්තිය ගාස්තු මත උපයනවිට ගෙවීම් බදු අයකර නොතිබුණු අතර 2014, 2015 හා 2016 වර්ෂ සඳහා එසේ අඩුකර නොතිබුණු මුළු උපයනවිට ගෙවීම් බද්ද රු.මිලියන 108.52 ක් විය.

(ඇ) 2017 නොවැම්බර් 06 දින සේවයෙන් පහ කරන ලද භෞතික විකිත්සකවරයෙකු 2018 අප්‍රේල් 11 දින රෝහලට එරෙහිව හෝමාගම කම්කරු විනිශ්චය සභාවේ නඩු පවරා තිබුණු අතර එම නිලධාරියා රෝහල විසින් අනුමත ලෙස සේවය අවසන් කර ඇති බවට කම්කරු විනිශ්චය සභාව තීරණය කර තිබුණි. ඒ අනුව අනුමත ලෙස සේවය අවසන් කර තිබූ වසර 4 ක කාලපරිච්ඡේදය වෙනුවෙන් වැටුප් හා දීමනා ලෙස රු.මිලියන 2.77 ක් ගෙවීමට සහ නිලධාරියා නැවත සේවයේ පිහිටුවීමට රෝහලට සිදුවී තිබුණු අතර නීතිඥ ගාස්තු වෙනුවෙන් රු.64,000ක් ඇතුළුව එකතුව රු.මිලියන 2.84 ක නිෂ්කාර්ය වියදමක් දැරීමට රෝහලට සිදු වී තිබුණි.

(ඉ) රෝහලේ පරිගණක පද්ධති (Systolic – Accpack) සම්බන්ධයෙන් කරන ලද විගණන පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) මහාරෝග්‍යශාලා මණ්ඩලයේ පවතින Systolic පරිගණක පද්ධතියේ Hospital Computer Module, Inventory Computer Module යන පද්ධති දෙකෙහි තොරතුරු Data Export කිරීමෙන් Accpack පරිගණක පද්ධතියට ඇතුළත් (Upload) කරන අතර Hospital Computer Module හා Inventory Computer Module හි තොරතුරු Accpack පරිගණක පද්ධතියට ඇතුළත් කිරීමෙන් පසු සිදුවන වෙනස්කම් නැවත Accpack පද්ධතිය තුළ (Update) යාවත්කාලීන නොකළ අවස්ථා නියැදි පරීක්ෂණයකදී අනාවරණය විය. මේ නිසා රෝහල් ගාස්තු ආපසු ගෙවීම් (refund), අවලංගු කරනු ලබන භාණ්ඩ ලැබීම් පත්‍ර (GRN) සහ අවලංගු කරනු ලබන රෝහල් ගාස්තු බිල්පත් වෙනුවෙන් නිකුත් කරන නව භාණ්ඩ ලැබීම් පත්‍ර හෝ නව රෝහල් ගාස්තු බිල්පත් ඇතුළත් කිරීමේදී තොරතුරු කිහිපවරක් Accpack පරිගණක පද්ධතියට ඇතුළත්වීමේ අවදානමක් පවතින බවද නිරීක්ෂණය විය. Accpack පරිගණක පද්ධතිය තුළ පවතින ගැනුම් පිරිවැය සහ ණයහිමියෝ රු.මිලියන 4.75 කින්ද, ණයගැතියෝ සහ රෝහල් ගාස්තු ආදායම රු.මිලියන 1.84 කින්ද වැඩියෙන් දක්වා ඇති බව සිදු කළ නියැදි පරීක්ෂණයේදී අනාවරණය විය. රෝහලේ පවතින පරිගණක පද්ධති අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවයක් (System link) ඇතිකර නොතිබීම හේතුවෙන් මෙම පරිගණක පද්ධතිවල පවතින තොරතුරු සියල්ලම යාවත්කාලීන වීම Accpack පරිගණක පද්ධතියට ඇතුළත් නොවීම සහ පරිගණක පද්ධතියේ දත්ත ඇතුළත් කිරීම, පරීක්ෂා කිරීම හා අනුමත කිරීමට අදාළ ක්‍රියාපටිපාටි නිසි අධිකාරී බලයක් යටතේ ක්‍රියාත්මක නොවීමත් එම ක්‍රියාවලිය පිළිබඳ අභ්‍යන්තර පාලනය ඉතා දුර්වල තත්ත්වයක පැවතීම හේතුවෙන් වැරදි හා වංචා සිදුවීමේ ඉඩකඩක් පැවතිය හැකි බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(ii) Ward Register හි අදාල දිනට රෝහල් ගතවී සිටි රෝගීන් සම්බන්ධයෙන් (Current) පරීක්ෂාවේදී එදිනට රෝහලින් බැහැර වී ඇති එහෙත් බිල්පත් පියවී නොතිබුණු රෝගීන් 14 ක් රෝහල තුළ ඇතුළත් වී සිටින රෝගීන් ලෙස පරිගණක පද්ධතිය තුළ පෙන්නුම් කරන බවත් එම රෝගීන් 12 දෙනෙකු සඳහා ඇතුළත් වූ දින සිට විගණිත දිනය දක්වාම බිල්පත් සැකසෙමින් පැවති අතර අනෙක් රෝගීන් දෙදෙනා වෙනුවෙන් දින 329ක් සහ දින 5ක් සඳහා එකතුව රු.මිලියන 23.98 ක බිල්පත් සකස්කර තිබුණි. මෙම ඇඳ ඉහපත් වාර්තාවන්ට අදාල රෝගීන් දැනට රෝහල්ගතව සිටින රෝගියෙකු ලෙස පරිගණක පද්ධතිය තුළ නිරූපණය වීමට හේතුවූ කරුණු විගණනයට අනාවරණය නොවුණි. වර්ෂ 1 සිට 7 අතර කාලයක් තිස්සේ පැවත එන මෙම බිල්පත් ශේෂ හඳුනාගෙන එම ශේෂ නිරවුල් කර ගැනීමට විගණිත දිනය වන 2022 අගෝස්තු 26 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(iii) රෝහලේ පරිගණක පද්ධතියෙහි (Systolic – Hospital) Ward Register හි Bill Finalized යන අයිතමය පරීක්ෂා කිරීමේදී රෝගී වාට්ටු 5 කට අදාලව රෝගීන්ගේ අවසන් බිල්පත සකසා එම රෝගීන් රෝහලෙන් පිටව ගොස් තිබුණද, පරිගණක පද්ධතිය තුළ තව දුරටත් රෝගීන් ලෙස පෙන්නුම් කරන රෝගීන් 16 දෙනෙකු සිටින බව නිරීක්ෂණය විය. ඉන් රෝගීන් 5 දෙනෙකු ගෙවිය යුතු බිල්පත් වලින් කොටසක් පියවා රෝහලෙන් පිටව ගොස් තිබුණු අතර ලැබිය යුතු මුදල් රු.67,195 ක් පරිගණක පද්ධතියේ ලැබිය යුතු අගයක් ලෙස දක්වා නොතිබුණි. කෙසේ වුවද රෝගීන් විසින් සම්පූර්ණ බිල්පත් නොපියවා රෝහලෙන් පිටව යාමට අවසර දීම විගණනයේදී මතභේදාත්මක කරුණක් විය.

(iv) මූල්‍ය ප්‍රකාශන සැකසීම සඳහා අවශ්‍ය දත්ත ලබා ගැනීමෙන් පසුව පද්ධතියේ ඇතුළත් වාර්තා වෙනස් කිරීමට ඇති පහසුකම අහුරා තැබිය යුතු වුවද එසේ සිදුකර නොතිබුණි.

(ඊ) මහාරෝග්‍යශාලා මණ්ඩලය විසින් හැටන් නැෂනල් බැංකුව හා මහජන බැංකුව යන ආයතන වෙත තම ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමට කුලී පදනම මත රෝහල් පරිශ්‍රයෙන් ඉඩකඩ වෙන්කර දී තිබුණද රෝහල සහ එම ආයතන අතර බදු කුලී ගිවිසුමක් ඇතිකර ගෙන තිබුණු බව තහවුරු නොකෙරුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ සිදුකරන ලද රසායනාගාර පරීක්ෂණ සම්බන්ධයෙන් කරන ලද පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය.

(i) ආයතනය විසින් Hematology සහ Bio Chemistry අංශ මගින් සිදු කර ඇති රාත්‍රී රසායනාගාර පරීක්ෂාවන් සම්බන්ධයෙන් පවත්වාගෙන යන ලේඛණයට අනුව රාත්‍රී කාලයේ සිදු කරන ලද පරීක්ෂණ ප්‍රමාණය සහ පරිගණක පද්ධතියෙහි පවතින රාත්‍රී සාම්පල ලබා ගැනීමේ වාර්තාවෙහි (Sample acceptance Report) සඳහන් පරීක්ෂණ ප්‍රමාණය සමඟ සැසඳීමක් සිදුකර නොතිබුණි. 2021 ජනවාරි මස සිට දෙසැම්බර් මාසය දක්වා වූ කාල පරිච්ඡේදයට අදාලව රාත්‍රී කාලයේදී සිදුකරන ලද සියලුම පරීක්ෂණ සම්බන්ධයෙන් සිදුකරන ලද පරීක්ෂාවේදී Hematology අංශය විසින් ඉදිරිපත් කරන ලද ලේඛනවල ඇතුලත් පරීක්ෂණ

සංඛ්‍යාවට වඩා පරිගණක ගත කර තිබූ පරීක්ෂණ සංඛ්‍යාව 15,556 කින් අඩුවී තිබූ අතර Biochemistry අංශය විසින් ඉදිරිපත් කර තිබූ ලේඛනවල ඇතුලත් පරීක්ෂණ සංඛ්‍යාවට වඩා පරිගණක ගත කර තිබූ පරීක්ෂණ සංඛ්‍යාව 40,059 කින් වැඩිවී තිබූ බව නිරීක්ෂණය විය. එසේ වෙනස්කම් ඇතිවීමට හේතු සොයාබලා නිවැරදි කිරීමට අදාල අංශ විසින් කටයුතු කර නොතිබුණි.

(ii) Hematology සහ Biochemistry අංශය විසින් 2021 වර්ෂය තුළ රාත්‍රී සහ දහවල් කාලයේ සිදු කරන ලද පරීක්ෂණ සඳහා පරිගණක පද්ධතිය වෙත ඇතුළත් කර තිබුණු නියැදි ප්‍රමාණය (Sample acceptance Report) එකතුව 505,064ක් විය. ඒ අනුව දහවල් කාලයේදී Hematology පරීක්ෂණාගාර සඳහා රසායනාගාර තාක්ෂණික ශිල්පීන් 7 ක් හා Biochemistry පරීක්ෂණාගාරය සඳහා රසායනාගාර තාක්ෂණික ශිල්පීන් 8 ක් සේවයේ යෙදෙන නමුත් රාත්‍රී සේවා සඳහා එක් අංශයකට එක් රසායනාගාර තාක්ෂණික ශිල්පියෙකු පමණක් සේවයේ යොදවනු ලැබේ. මෙම අංශ දෙකෙහිම රසායනාගාර තාක්ෂණික ශිල්පීන් 15 ක් විසින් 2021 වර්ෂය තුළ දහවල් කාලයේ සිදු කරන ලද නියැදි පරීක්ෂණ සංඛ්‍යාව 239,819 ක් වූ අතර රසායනාගාර තාක්ෂණික ශිල්පීන් දෙදෙනෙකු විසින් රාත්‍රී කාලයේ නියැදි පරීක්ෂණ 265,245 ක් සිදුකර ඇති බව අනාවරණය විය. මේ අනුව එක් එක් අංශ විසින් දිවා කාලයේ සිදු කරනු ලබන පරීක්ෂණ සංඛ්‍යාවට වඩා වැඩි පරීක්ෂණ සංඛ්‍යාවක් එක් නිලධාරියෙකු විසින් රාත්‍රී කාලයේ සිදුකර තිබුණු බව නිරීක්ෂණය විය.

(ඌ) මහාරෝගාශාලා මණ්ඩලය පිහිටි පරිශ්‍රයේ ප්‍රධාන සැලැස්ම (Master Plan) පිළියෙල කිරීම සඳහා උපදේශක ගාස්තු වශයෙන් මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යංශයට රු.508,950 ක් 2017 වර්ෂයේදී ගෙවා තිබුණු අතර 2021 දෙසැම්බර් 31 දින වන විටත් එම කාර්යය සම්පූර්ණ කරවා ගෙන නොතිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ 04 ක රෝහලේ සමස්ත කාර්ය සාධනය පහත පරිදි විය.

	2018	2019	2020	2021
රෝහලේ ඇඳන් සංඛ්‍යාව	1,061	1,065	1,072	993
ඇතුලත් වූ රෝගීන් සංඛ්‍යාව	58,849	62,466	45,976	39,916
සායන සඳහා රෝගීන් සහභාගී වීම	182,170	190,716	138,502	136,085
සම්පූර්ණ මරණ සංඛ්‍යාව	745	847	594	813
සිදු කර ඇති විවිධ පරීක්ෂණ හා ශල්‍යකර්ම සංඛ්‍යාව	1,522,335	1,678,874	1,256,986	1,252,909

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2018 වර්ෂයට සාපේක්ෂව 2021 වර්ෂයේ රෝහලේ ඇඳන් සංඛ්‍යාව සියයට 6කින් හා ඇඳන් භාවිතය සියයට 12 කින් අඩුවීමක් නිරීක්ෂණය විය.

(ii) 2018 වර්ෂයට සාපේක්ෂව 2021 වර්ෂයේදී රෝහලට රෝගීන් ඇතුළත්වීම් සියයට 32 කින් හා සායන සඳහා පැමිණීම් සියයට 25 කින් අඩුවී තිබුණි.

(iii) රෝහල විසින් කරනු ලබන පරීක්ෂණ හා ශල්‍යාකර්මවල ප්‍රගතියේ පහළ යාමක් නිරීක්ෂණය වූ අතර එය 2018 වර්ෂයට සාපේක්ෂව 2021 වර්ෂයේදී පරීක්ෂණ 269,426 ක අඩුවීමක් නිරීක්ෂණය විය.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

ශ්‍රී ජයවර්ධනපුර මහරෝගාශාලා මණ්ඩලයේ 2021දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනය සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.			
විගණන නිරීක්ෂණ			නිවැරදි කර ගැනීමට ගනු ලැබූ ක්‍රියාමාර්ග
1.2	නත්ත්වාගණනය කළ මිතය සඳහා පදනම		
	(අ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1 හි 48 ඡේදයප්‍රකාරව, වත්කම් හා වගකීම් සහ ආදායම් හා වියදම් හිලව් නොකළ යුතු වුවද, 2021 දෙසැම්බර් 31 දිනට රෝහල් ගාස්තු ණයගැති ගිණුම්වල පැවති රු.මිලියන 9.95 ක බැර ශේෂවලට හා වෙළඳ ණයකිම් ගිණුමේ පැවති රු.මිලියන 1.58 ක් වූ හර ශේෂවලට හේතු හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් සිදු කරනු වෙනුවට එම ගිණුම්වල ප්‍රතිවිරුද්ධ ශේෂවලට එරෙහිව හිලවකර දක්වා තිබුණි. එමෙන්ම රෝහලේ කාර්යමණ්ඩලය සඳහා නොමිලේ වෛද්‍ය ප්‍රතිකාර වෙනුවෙන් දරන ලද රු.මිලියන 118.03ක් හා ආගමික ප්‍රජකවරුන් හා අනෙකුත් අය වෙත නොමිලේ වෛද්‍ය ප්‍රතිකාර වෙනුවෙන් දරන ලද රු.මිලියන 35.31 ක් රෝහල් ගාස්තු ආදායමෙන් ද හිලව් කර මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1 හි 48 ඡේදයට පටහැනිව ණයගැතියන් හෝ ණයකිම්කරුවන්ද ආදායම් වියදම්ද හිලව් කර නොමැත. ණයගැති ගිණුම් වල ඇති බැර ශේෂය නිවැරදි කිරීම සඳහා එම ගිණුම් සැසඳීම් කල අතර එහිදී එම බැර ශේෂය ඇතිවීමට හේතු වූ මූලික ගිණුම්කරණ දෝෂය සොයා ගැනීමෙන් පසුව ණයගැති ගිණුම් නිවැරදි කර ඇත. උදාහරණ වශයෙන් ණයගැති ගිණුමට හර ලෙස සටහන් විය යුතු ගිණුම් සටහන් පෙර ගෙවුම් (Prepayment) යටතේ ගිණුම්ගත කර තිබීම. මෙයට අදාල සියළුම නිවැරදි කිරීම් වලට අදාල තොරතුරු ගිණුම් අංශය සතුව පවතින අතර වැඩිදුර පරීක්ෂා කිරීමට විගණන අංශය වෙත ලබා දීමේ හැකියාව ඇත. වෙළඳ ණයකිම්කරුවන්ගේ හර ශේෂය බැර ශේෂයට හිලව් කිරීමක් සිදු කර නොමැති අතර මෙහිදී ණයකිම් ගිණුම් සැසඳීම් කර එම ගිණුම් වල හර ශේෂය ඇති වීමට හේතු වූ ගිණුම්කරණ දෝෂය නිවැරදි කර ඇත. උදාහරණ වශයෙන් ණයකිම් ගිණුමට බැර ලෙස සටහන් විය යුතු GRN සටහන් වලට අදාල ගෙවීම් (Advance) ලෙස ගිණුම් ගත කර ඇත. අදාල විස්තර දැනටමත් විගණන අංශය වෙත ලබා දී ඇත. කාර්ය මණ්ඩලය සඳහා නොමිලේ වෛද්‍ය ප්‍රතිකාර සඳහා දරණ ලද රු.118,030,144.00ක් හා ආගමික ප්‍රජකවරුන් සඳහා නොමිලේ වෛද්‍ය ප්‍රතිකාර සඳහා දරන ලද රු.36,310,484.00ක් රාජ්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති 1 හි 48 හා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත 9 අනුව නිවැරදිව ගිණුම් ගත කර තිබේ. මෙම මුදල් අනාගත මූල්‍ය ප්‍රවාහයන් තුල උපලබ්ධි නොවන අතර මූල්‍ය කාර්ය සාධන ප්‍රතිඵලයට කිසිදු වෙනසක් සිදු

			නොවන අතර එයින් මූල්‍ය කාර්ය සාධන වාර්තා පරිහරණය කරන්නන් නොමඟ යැවීමක් ද සිදු නොවේ. මෙය මෙම ගිණුම් ප්‍රමිතියේ උදාහරණ ලෙස දක්වා ඇති අඩමාණ ණය වෙන්කිරීම් වලට සමාන වේ. එසේම ගිණුම්කරණ ප්‍රමිත 9 යටතේ ගිණුම් වලින් පෙන්විය යුත්තේ ශුද්ධ උපලබ්ධි වූ අගය (Net Realizable Value) හෝ සාධාරණ අගය වේ. (Fair Value) මෙහිදී ප්‍රධාන ලෙජරයේ හෝ ශේෂ පිරික්සුමේ ශේෂ වලින් හිලව් කිරීමක් සිදු කර නොමැත. මූල්‍ය ප්‍රකාශන වල මෙම සටහන වෙනම හෙලිදරව් කිරීම මඟින් මූල්‍ය ප්‍රකාශ පරිහරණය කරන්නන් හට වැඩි විස්තර ලබා දීමක් සිදුකර ඇත. මෙම ගිණුම්කරණ ප්‍රමිත 1හි ඡේද 50 යටතේ මෙය පැහැදිලි කර ඇත. මෙම කරුණු සලකා බලා මෙම විගණන විමසුම් ඉවත් කිරීමට කටයුතු කරන මෙන් ඉල්ලා සිටිමි.
	(ආ)	පසුගිය වසරේ කාර්යමණ්ඩල වියදම් යටතේ වර්ගීකරණය කර තිබූ රෝහලේ කාර්යමණ්ඩලයට නොමිලේ ලබාදුන් ඖෂධ සඳහා වූ වියදම් රු.මිලියන 51.65 ක් සමාලෝචිත වර්ෂයේ ද්‍රව්‍ය හා පරිභෝජන ද්‍රව්‍ය වියදම් (Materials & Consumables Used) යටතේ දක්වා තිබුණි. මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1 හි 55 හෝ 56 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය හෙලිදරව් කිරීම් සිදු කර නොතිබුණි.	ගිණුම්කරණ ප්‍රමිත 1හි 55 හා 56 ඡේද ප්‍රකාරව 2022 වර්ෂයේ හෙලිදරව් කිරීමට කටයුතු කරමි.
	(ඇ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 හි 47 ඡේදය ප්‍රකාරව, ප්‍රමාණාත්මක පූර්ව කාලපරිච්ඡේද වැරදි ඒවා සොයා ගැනීමෙන් පසුව නිකුත් කිරීම සඳහා අනුමත කරන පළමු මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහි වරද සිදුවූ කාලච්ඡේදය සඳහා ඉදිරිපත් කර ඇති සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කිරීමෙන් අතීතානුයෝගීව නිවැරදි කළ යුතු වුවද, එසේ නොකර පෙර වර්ෂ ගැලපීම් ලෙස රු.මිලියන 16.67 ක් 2021 ජනවාරි 01 දින ඉදිරියට ගෙනා සමුච්චිත ඌනතාවයට ගලපා තිබුණි. තවද පෙර වර්ෂ ගැලපීම් ගිණුමේ ශුද්ධ ශේෂය රු. මිලියන 19.29 ක් වුවද එය රු. මිලියන 16.67 ක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණු අතර රු. මිලියන 2.62 ක්වූ වෙනසට හේතු ඉදිරිපත් නොකෙරුණි.	මෙම ඡේදයේ යටතේ ගිණුම්කරණ ප්‍රමිත 3 (48) ඡේදය යටතේ අතීතානුයෝගීව නිවැරදි කිරීම් සිදු කර නොමැති බව පිළිගනු ලබන අතර එම ඡේදය යටතේ ඇති රු.මිලියන 2.6 ක් වූ වෙනසට හේතු මෙම ගිණුම් පරීක්ෂා කර විගණනයට ඉදිරිපත් කිරීමට ද ප්‍රමිත 3හි 48 ඡේදයට අනුව අදාල නිවැරදි කිරීම් සිදු කර විගණනයට සති 2ක් ඇතුලත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.

	(ඇ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන්, පිරිවැය රු. මිලියන3,555.50 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.	ආරම්භක අවස්ථාවේදී නියම කර තිබූ ඵලදායී ජීවිත කාලය අවසන් වූ පසුවත් මෙම වත්කම් රෝහල් භාවිතය සඳහා යොදාගෙන ඇති අතර මෙම ඇස්තුමේන්තු දෝෂය නිවැරදි කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කමිටුවක් පත් කර ඇත. මේ වනවිට ඉඩම් , ගොඩනැගිලි, මෝටර් රථ ප්‍රත්‍යාගණනය කිරීමේ කටයුතු අවසන් කර ඇත. ඒ අනුව ඊට අදාල ගිණුම්කරණ සංශෝදනයන් සිදු කර 2022 වර්ෂයේ ගිණුම් විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.
	(ඉ)	සමාලෝචිත වර්ෂය තුලදී ඇඳ ඉහපත් 25කට අදාල ණයගැති හා නිදහස් රෝහල් වියදම් වටිනාකම් නැවත නැවත රෝහල් පාලන ගිණුමට බැර කර තිබීම හේතුවෙන් රෝහල් ගාස්තු ආදායම රු.මිලියන 1.84 කින් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණු බව නියැදි පරීක්ෂණයකදී අනාවරණය විය.	මෙම පද්ධති දෝෂය පිළිබඳ සොයා බලා අදාල ගිණුම්කරණ නිවැරදි කිරීම් 2022 වර්ෂයේ දී සිදු කිරීමට බලාපොරොත්තු වෙමි. දැනට එකම BHT අංකයකින් දෙවරක් ආදායම ගිණුම් ගතවීම පද්ධතිය මඟින් අහුරා ඇත. අපගේ විමර්ශා අනුව මෙවැනි දෙයක් සිදුවී නොමැත.
	(ඊ)	වෘත්තිය ගාස්තු අයකිරීම් හා ආපසු ගෙවීම් ගිණුම්ගත කිරීමේ නිශ්චිත ක්‍රමවේදයක් හඳුනාගෙන නොතිබුණි.ණයලිපි(Credit Letter) මත රෝහලින් බැහැරව යන රෝගීන්ගේ රෝහල් ගාස්තුව හා වෘත්තීය ගාස්තුව නිශ්චිතව හඳුනාගැනීමකින් තොරව 2021 දෙසැම්බර් 31 දින රෝහල් ගාස්තු ආදායම් ගිණුමෙන් රු.මිලියන61.51 ක් ගෙවිය යුතු වෘත්තීය ගාස්තු ගිණුමට බැර කර තිබුණි.	මෙම දෝෂයන්ට හේතු වී ඇත්තේ වෘත්තිය ගාස්තු රෝහල් පරිගණක පද්ධතිය මගින් ගිණුම් ගත නොවීමයි.නමුත් 2022 වර්ෂයේ සිට සියලුම වෘත්තීය ගාස්තු උපචිත පදනම් මත ගිණුම්ගත කරනු ලැබේ.ඒට අමතරව වෘත්තිය ගාස්තු රෝහල් මෘදුකාංග පද්ධතිය හරහා රෝගියාගේ බිල්පේම් සඳහන් කිරීමේ ක්‍රමවේදයක් 2022 ඔක්තෝබර් මස 25 වන විට රෝහල විසින් ආරම්භ කර ඇත. රු.මි.61.5ට අදාල ගිණුම් සටහන ගෙවිය යුතු වෘත්තිය ගාස්තු නිවැරදිව හඳුනා ගැනීමෙන් පසුව රෝහල් ගාස්තු පාලන ගිණුමෙන් මාරු කර ඇත. වෘත්තිය ගාස්තු සටහන් කිරීම සඳහා වෙනම මෘදුකාංගයක් ක්‍රියාත්මක කරන අතර අදාල වෘත්තිය ගාස්තු හඳුනා ගැනීමෙන් පසු එම පද්ධතියේ ඇතුලත් කරනු ලැබේ. රු. මිලියන 3.62 සම්බන්ධව මහාධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවතින අතර නඩු කටයුතු සඳහා ගිණුම් අංශයෙන් බැහැරට අදාල ලිපිලේඛන ගෙන ගොස් ඇත. මෙය අවසන් වූ පසු ගිණුම් කුල අදාල ගැලපීම් සිදු කිරීමට බලාපොරොත්තු වෙමි.

	(ඇ)	2021 දෙසැම්බර් 31 දිනට ණයහිමියෝ, ණයගැතියෝ, ගෙවිය යුතු වෘත්තීය ගාස්තු , ආපදා ණය පොලී හා විවිධ ණයහිමියෝ යන විෂයන් 05කට අදාලව මූල්‍ය ප්‍රකාශන හා විගණනයට ඉදිරිපත් කළ ලැයිස්තු, ලේඛණ හා පරිගණක වාර්තා අනුව රු.මිලියන 87.49ක වෙනසක් පැවති අතර වෙනසට හේතු පැහැදිලි නොකෙරුණි.	I. ණයහිමියෝ මීට අදාල සැසඳීම් කටයුතු කෙරමින් පවතින අතර මේ වන විට බොහෝ සැසඳීම් කටයුතු අවසන් කර ඇත. II. ගෙවියයුතුවෘත්තීයගාස්තු වෘත්තීයගාස්තුමේවනවිටනිවැරදිවගිණුම්ගතකෙරෙනහෙයින්ඉදිරියේදිනිවැරදිවසැසඳීමකලපසුමෙවැනිවෙනස්කම්ඇතිනොවනු ඇත.අපගේ වාර්තා අනුව නිවැරදි බව හැඟියන බැවින් විස්තරාත්මක වාර්තාවක් විගණන අංශයෙන් ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. III. ණයගැතියෝ අදාල වෙනස්කම් නිර්ණය කිරීමට උපයෝගි කර ගත් විස්තර වාර්ථා විගණන අංශයෙන් ලබා ගෙන මේ පිළිබඳ වැඩිදුර පැහැදිලි කිරීම් සිදුකරනු ඇත. IV. ආපදාණයපොලී ආපදා ණය උපලේඛනයන් Manual ක්‍රමයට පොත් තැබීම් සිදු කර ඇත. ගිණුම්කරණ ලේඛරයන් සඳහා වැටුප් පද්ධතියෙන් ලබා ගන්නා වාර්තා උපයෝගි කර ගනී. අදාල අපදා ණය පොලී පෙන්වා දී ඇති වෙනස (රු.19,522) ට හේතුවී ඇති කරුණු පිළිබඳ සොයා බැලීමට කටයුතු කරමි. V. විවිධණයහිමියෝ අදාල වෙනස ඇතිවී තිබෙන්නේ ගිණුම් හිමියන්ගේ ගිණුම් වැරදි නිවැරදි කිරීමක් සිදු කිරීමේදී මෙම ගිණුමට රු.726,750.00 ක මුදලක් හරවීම් හේතු කොටගෙනය. 2022 වර්ෂයේ දී මූල්‍ය ප්‍රකාශනවල එය නිවැරදි කිරීමට කටයුතු ඇත. ඉතිරි වෙනස්කමට හේතු වන්නේ රු. 27,300.00 ක් හා රු.2,000.00 ක ණය හිමි ශේෂ 2 ක් අවසන් ගිණුම් පිළියෙල කිරීමේ දී විවිධ ණයහිමියන් යටතේ පෙන්වා ඇති බැවිනි.
	(ඈ)	2021 දෙසැම්බර් 31 දිනට එකතුව රු.මිලියන 491.07 ක්වූ රේහල් ගාස්තු ණයගැතියන්, වෙළඳ ණයහිමියන්,සේවා ගාස්තු හා ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පත් යන ගිණුම් විෂයයන් 04ක් සම්බන්ධයෙන් කාල විශ්ලේෂණ, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැති සහඋපයෝගි ලේඛන ආදී සාක්ෂි විගණනයට	1.ණයගැතියන්/වෙළඳ ණයහිමියන් ණයහිමියන්සඳහාශේෂසනාකනලිපිමේවන විට අදාල ආයතන වෙත යොමු කර ඇත. දැනට පවතින ගිණුම්කරණ පද්ධතිය මගින් ලබාගත හැකි කාල විශ්ලේෂනය විගණනය වෙත ඉදිරිපත් කර ඇත.

		ඉදිරිපත් නොකිරීම හේතුවෙන් සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ සත්‍යාක්ෂණය කිරීමට හෝ විගණනයේදී පිළිගැනීමට නොහැකි විය.	2. සේවා ගාස්තු අදාල අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සොයා බලා ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. 3. ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පත් ගෙවන තැන්පත් හා නොගෙවන ටෙන්ඩර් තැන්පතු සඳහා ලේඛනයක් නඩත්තු කිරීමට සැපයුම් අංශය උපදෙස් ලබාදී ඇත. එසේම ඉදිරියේදී ආපසු ගෙවන හා නොගෙවන ලෙස අදාල ලේඛනයේ වෙන වෙනම සටහන් කර නොමැති කිසිදු තැන්පත් මුදලක් බාර නොගන්නා ලෙස මුදල් අයකැමි වෙත උපදෙස් ලබා දී ඇත.
	(ඔ)	මහාරෝගීශාලා මණ්ඩලය විසින් 2010 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වෛද්‍ය සැපයුම් අංශය වෙතින් මිලදී ගෙන තිබුණු ඖෂධ හා වෙනත් ශල්‍ය ද්‍රව්‍ය සඳහා වෛද්‍ය සැපයුම් අංශය වෙතින් මිලදී ගෙන තිබුණු ඖෂධ හා වෙනත් ශල්‍ය ද්‍රව්‍ය සඳහා ගෙවිය යුතු මුදල රු. මිලියන 698.68 ක් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් රෝහල වෙත යොමු කරන ලද රෝගීන්ට සිදු කරන ලද හෘද සැත්කම් වෙනුවෙන් අමාත්‍යාංශයෙන් තවදුරටත් ලැබිය යුතු රු. මිලියන 748.55 ක මුදලට හිලව් කර තිබුණි. මේ සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර අමාත්‍යාංශයෙන් තවදුරටත් ලැබිය යුතු රු.මිලියන49.87 ක මුදල ණයගැති උපලේඛණයේ දක්වා නොතිබුණි.	2014/09/19 දින අමාත්‍යාංශයේ ලේකම් තුමියගේ අනුමැතිය හා අදාල වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ මෙම හිලවු කිරීම සිදු කර ඇත. එසේම භාණ්ඩාගාරයේ උපදෙස් අනුව ඉදිරියේදී මෙම රෝගීන් වෙනුවෙන් ගෙවිය යුතු වටිනාකම් සඳහා වෙනම වැය ශීර්ෂයක් ලබා ගැනීමට සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත.
	(ඒ)	Systolic පරිගණක පද්ධතිය සහAccpack පරිගණක පද්ධතිය අතර සම්බන්ධතාවයක් නොමැති වීම හේතුවෙන් පරිගණක පද්ධති දෙක අතර පැවති විවිධ ගැලපීම් වලට අදාලව 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන තුළ වෙළඳ ණයගිම්යෝ රු. මිලියන 115 කට ආසන්න අගයක් ජනල් වවුචර් පිළියෙල කිරීමකින් තොරව ලියාහැර තිබුණි. අදාල ගැලපුම් පෙර වර්ෂ ගැලපුම් ගිණුම් මඟින් සිදු කිරීමකින් තොරව ශුද්ධ ශේෂය රු. මිලියන 29.32 ක් සමුච්චිත ලාභලාභ ගිණුමට ගලපා තිබුණි. විගණන නියැදි පරීක්ෂාවට අනුව අවස්ථා 03කදී රු. මිලියන 35.29ක මුදලක් ණයගිම්යන්ට ගෙවීමකර තිබුණද,එය කේවල ණයගිම් ශේෂ වලට ගැලපීමකින් තොරව ලාභලාභ ගිණුමට ගලපා තිබුණි.	පෙර වර්ෂවල පෙන්වා දී ඇති ණයගිම්යන්ගේ ශේෂවල පැවති සෘණ අගයන් හා ගිණුම් කරන දෝෂ නිවැරදි කිරීමේ දී අදාල ගිණුම් කරන මෘදුකාංගයේ ඇති ක්‍රම වේදය වන්නේ හර/බැර සටහන් මඟින් ගැලපීම් කිරීමයි. ඒ අනුව 2021 වර්ෂයේ දී ණය හිමියන්ගේ සැලකිය යුතු ප්‍රමාණයක් වැරදි නිවැරදි කිරීමට කටයුතු කරන ලදි. කරන ලද නිවැරදි කිරීම්වලට අදාල ලේඛන විගණන අංශය වෙත ලබාදී ඇත. තවදුරටත් එම සැසඳීම් කටයුතු සිදුකරමින් පවති.

	(ඔ)	ක්ෂය කිරීමේ ප්‍රතිපත්තිය අනුව වෙනත් ගොඩනැගිලි පිරිවැය මත සියයට 5ක් ක්ෂය කළ යුතු වුවත්, සියයට 2ක් ක්ෂය ගණනය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අලාභය රු. මිලියන 6.63 ක් අඩුවෙන් සහ ජංගම නොවන වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.	මෙම ගිණුම්කරන දෝෂය පිළිගනිමි. 2022 ගිණුම්තුල අවශ්‍ය ගැලපීම් සිදුකිරීමට කටයුතු කරමි.
	(ඕ)	ඉදිකිරීම් අවසන් කළ කාන්තා හෙද නේවාසිකාගාර ගොඩනැගිල්ල සඳහා දරන ලද සත්‍ය වියදම රු.මිලියන 413.16ක් වුවත් සමාලෝචිතවර්ෂයේදිඅනෙකුත් ගොඩනැගිලි යටතේ රු.මිලියන477.42 ක් ලෙස ප්‍රාග්ධනිත කර තිබීම හේතුවෙන් ගොඩනැගිලි වටිනාකම රු.මිලියන 64.26 ක් වැඩියෙන්දක්වාතිබුණි.එමෙන්ම ගොඩනැගිල්ලේ පිරිවැය කෙරීගෙන යන වැඩ ගිණුමට රු.මිලියන486.01 ක් ගැලපුම් කිරීම හේතුවෙන් කෙරීගෙන යන වැඩ ගිණුමේ අගය රු.මිලියන 72.85 ක් අඩුවෙන් දැක්වුණි.	මෙම දෝෂය පිළිගන්නා අතර 2022 වර්ෂයේදි ගිණුම්වල නිවැරදි කිරීමට කටයුතු කරමි.
	(ක)	2020 වර්ෂයේ විගණන වාර්තාවට අනුව කොන්ත්‍රාත් 4ක රු.මිලියන 2.17ක ගිණුම්ගත නොකල රැඳවුම් මුදල් සමාලෝචිත වර්ෂයේ නිවැරදි කිරීමෙදි රු.මිලියන 1.95ක මුදලක් වත්කම් ගිණුමට හර කිරීම වෙනුවට සමුච්චිත ලාභලාභ ගිණුමට හර කිරීම හේතුවෙන් සමුච්චිත ලාභය සහ එම වත්කම්වල අගය රු.මිලියන1.95ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.	මෙම දෝෂය පිළිගනිමි. 2022 වර්ෂයේ දි ගිණුම්තුල මෙය නිවැරදි කිරීමට කටයුතු කරමි. රු.220,200.00 ක මුදලද ගෙවීම් කර නොමැති බව තහවුරු කර ගැනීමෙන් පසු ගිණුම්ගත කිරීමට කටයුතු කරමි.
	ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.		
1.3	මණ්ඩලයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු		
	මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන මණ්ඩලයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස්වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.		

	මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබාගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබා ගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි. මණ්ඩලයේ **2021** වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම් සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ **154(6)** ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේ දී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.	
1.4	මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම	
	මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි. මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි. **2018** අංක **19** දරන ජාතික විගණන පනතේ **16(1)** උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.	

1.5	මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම	
	සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී. ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බැවින් යුතුව ක්‍රියා කරන ලදි. මාවිසින් තව දුරටත්, • ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවශ්‍යතාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුයෙන් සිදුවන ප්‍රණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි. • අභ්‍යන්තර පාලනයේ ඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි.	

	• භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය,ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී. • සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩපැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය වීකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය. • මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී. මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.	
2.	වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව		
	2.1	**2018** අංක**19** දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.	
	2.1.1	**2018** අංක **19** දරන ජාතික විගණන පනතේ **12 (අ)** වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම් කොටසේ විස්තර	

		කර ඇති කරුණු වලින් වන බලපෑම හැර විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සංස්ථාව පවත්වාගෙන ගොස් තිබුණි.	
	2.1.2	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) ඇ (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.	
	2.1.3	මෙම වාර්තාවේ 1.2(ආ), (ඇ), (ඒ) හා (ඕ) ඡේදවල දැක්වෙන නිරීක්ෂණ හැර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත්ව ඇත.	
	2.2	අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම් තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.	
	2.2.1	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධව යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.	
	2.2.2	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.	
	නීති රීති හා විධිවිධානවලට යොමුව		
	(අ)	<u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 2.1 හා 2.2 සිට 2.6 දක්වා වූ වගන්ති.</u> කාර්ය මණ්ඩලයේ සෑම සේවයකම හා සෑම ශ්‍රේණියකම තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම්, තනතුරෙහි වැටුප් පරිමාණය, වයස් සීමාව සහ	මේ සම්බන්ධයෙන් තෝරා පත්කර ගන්නා ලද උපදේශක මහතා ගිවිසුමේ සඳහන් කොන්දේසි ප්‍රකාරව කටයුතු නොකිරීම හේතුවෙන් බදවා ගැනීමේ පටිපාටි යකස් කිරීම සඳහා අභ්‍යන්තර කමිටුවක් පත් කර ඇත.

		අදාළ අනෙකුත් විස්තර ඇතුළත්කර බඳවා ගැනීමේ පටිපාටි පිළියෙල කර ආයතන සංග්‍රහයේ දක්වා ඇති ක්‍රියා පිළිවෙල අනුගමනය කරමින් එකී පටිපාටි යඳහා අදාළ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළයුතු වුවද, 2022 දෙසැම්බර් 15 දින වන විටත් බඳවා ගැනීම් පටිපාටි පිළියෙල කර අනුමැතිය ලබාගෙන නොතිබුණි.	
	(ආ)	<u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූදල් රෙගුලාසි සංග්‍රහය, මූදල් රෙගුලාසි 395 (ආ) සහ (ඇ) ජේදය</u> බැංකු ගිණුම් යඳහා එක් එක් මාසය අවසානයේ ඇති ගණුදෙනු තත්ත්වය සම්බන්ධයෙන් ඊළඟ මාසයේ 15 දිනට පෙර බැංකු සැසඳුමක් පිළියෙල කළ යුතු වුවත් රෝහලේ ජංගම ගිණුම් අංක 227982 ගිණුමට අදාලව බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	ඉදිරියේදී මෙවැනි ප්‍රමාදයන් සිදු නොවීමට අවශ්‍ය උපදෙස් ලබාදීමට කටයුතු කර ඇත. එසේම බැංකු සැසඳුම් යඳහා අවශ්‍ය වන තොරතුරු දිනපතා ලබා ගැනීමට හැකි වන පරිදි අදාල බැංකු සහ ගිණුම් පද්ධතියේ අවශ්‍ය වෙනස්කම් සිදු කිරීමට කටයුතු කර ඇත.
	(ඇ)	<u>1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනතේ 5 වගන්තිය හා 1992 අංක 62 දරන සංශෝධිත පාරිතෝෂික ගෙවීමේ පනත.</u> නියමිත දිනයන් තුළ පාරිතෝෂික නොගෙවීම හේතුවෙන් 2021 ජූනි 18 දින සේවයෙන් ඉල්ලා අස්වී තිබුණු නිලධාරිනියක් වෙත අධිභාර ලෙස රු.127,062 ක නිශ්කාර්ය වියදමක් දරා තිබුණි.	මේ සම්බන්ධයෙන් මූලික විමර්ෂණයක් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇති අතර දැනට එය සිදු කරමින් පවතී.
	(ඈ)	<u>2003 ජූනි 02 දිනැති අංක පිරිඩි/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය</u> මූල්‍ය වර්ෂය අවසන් වීමෙන් දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත අනුමත මූල්‍ය ප්‍රකාශන හා වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් ඉදිරිපත් කළ යුතු වුවද, 2021 මූල්‍ය වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන මාස 08කට වඩා වැඩි කාල ප්‍රමාදයක් සහිතව 2022 නොවැම්බර් 08 දින ඉදිරිපත් කර තිබුණි.	මෙම විගණන විමසුම් සමග එකඟ වෙමි. 2022 වර්ෂයේ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කරමි.
	(ඉ)	<u>සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ 2006 මැයි 10 දිනැති පොදු චක්‍රලේඛ ලිපි අංක Q2-84/2006</u> රසායනාගාර කාර්යමණ්ඩලය විසින් රාත්‍රී කාලය තුල සිදු කරනු ලබන රසායනාගාර පරීක්ෂණ යඳහා කැලි පදනම් මත දීමනා ගෙවීමේදී චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවන ලෙස රාත්‍රී කාලයේ සේවයේ යෙදෙන වෛද්‍ය රසායනාගාර තාක්ෂණික නිලධාරීන් විසින් ඉල්ලුම් කරනු ලබන සියලුම පරීක්ෂණ යඳහා කැලි පදනම් මත ගෙවීම්	මෙහිදී රෝගී සත්කාර සේවයට මුල්තැන දිකටයුතු කර ඇති අතර අදාල චක්‍රලේඛය මඟින් සීමිත පරීක්ෂණ ප්‍රමාණයක් යඳහා පමණක් කැලි පදනම් මත දීමනා ගෙවීමට ඉඩ ලබාදීම තුලින් මෙම තත්වය උද්ගතවී ඇත. කෙසේ නමුත් ඊට පිලියමක් ලෙස 2022.08.17 දිනැති ලිපිය මඟින් රසායනාගාරයේ සියලු අංශ නියෝජනය වන පරිදි විශේෂඥ වෛද්‍යවරුන්ගේ අනුමැතිය සහිත පරීක්ෂණ ලේඛනයක්

		කිරීම හේතුවෙන් 2021 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුල විවිධ රසායනාගාර පරීක්ෂණ 154,687ක් සඳහා රු.මිලියන 3.48 දීමනා වැඩිපුර ගෙවා තිබුණි.	පිළියෙළ කර එය පොදු වක්‍රලේඛ ලිපි අංක 2-84/2006 ට අදාල වන පරිද්දෙන් අනුමැතිය ලබාගෙන ඇත.
	ඊ.	2016 ඔක්තෝබර් 10 දිනැති අංක ඩීඑමඑස්/1758-Vol 1 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපිය. අනුමත කාර්ය මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කරන යෝජනා සකස්කර ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව වෙත යොමුකර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු වුවද, 2020 දෙසැම්බර් 31 දින වන විටත් ඒ අනුව කටයුතුකර නොතිබුණි.	මේ වන විට ශ්‍රී ජයවර්ධනපුර කාර්ය මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අවශ්‍ය යෝජනා සැකසීම අවසන් අදියරේ පවතින අතර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමුකොට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරනු ඇත.
	උ.	2019 දෙසැම්බර් 17 දිනැති අංක PFD 08/2019 දරන රාජ්‍ය මුදල් වක්‍රලේඛය 2020 වර්ෂයේ සිට විදයුත් ප්‍රසම්පාදන ක්‍රමවේදයක් කිරීමට කටයුතු කළ යුතු වුවත් වක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	මෙම ප්‍රකාශය සමඟ එකඟ වෙමි. මේ සම්බන්ධයෙන් 2021 වර්ෂයේ මූලික කටයුතු ආරම්භ කර තිබේ. ඒ අනුව අංක 446.09.2 දරණ රෝහල් මණ්ඩල තීරණයද ලබාදී ඇති අතර එම කාලය තුලදී මුදල් අමාත්‍යාංශයේ අදාල වෙබ් අඩවිය වන promise.lk නී ලියාපදිංචි වීමද සිදුකර තිබේ. නමුත් පසුගිය කාලයේ පැවති COVID වසංගත තත්වය මත එය නියමිත අයුරින් ක්‍රියාත්මක කර ගත නොහැකි වී ඇත. ඉදිරියේදී මුදල් අමාත්‍යාංශයේද උපදෙස් ලබා ගනිමින් මෙය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.
	ඌ.	2020 ඔක්තෝබර් 26 දිනැති අංක 02/2020 හා 2020 පෙබරවාරි 21 දිනැති අංක 01/2020 දරන කළමනාකරණ සේවා වක්‍රලේඛ බඳවාගැනීමේ පටිපාටි පිළියෙල කර අදාල පාර්ශව වෙතින් අනුමැතිය ලබාගෙන ඇත්නම් පමණක් අනුමත තනතුරු පුරප්පාඩු පිරිවීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමැතිය ලබා ගත යුතු නොවන නමුත් රෝහල් කාර්ය මණ්ඩලය සඳහා බඳවා ගැනීමේ පටිපාටි පිළියෙල කර නොතිබියදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව 2020 හා 2021 වර්ෂයන් තුළ සේවක කාණ්ඩ 8ක් සඳහා තාවකාලික, කොන්ත්‍රාත්, අනියම් හා ස්ථිර පදනම මත නිළධාරීන්ට 237 ක් බඳවා ගෙන තිබුණි.	කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇත්තේ ස්ථිර සේවකයින් බඳවා ගැනීම සඳහා වේ.නමුත් සියළු තනතුරු සඳහා බඳවා ගැනීම සිදුකිරීමේදී හා (තාවකාලික /කොන්ත්‍රාත්) අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සිදු කරනු ලබයි.රෝහල් කටයුතු කාර්යක්ෂමව පවත්වාගෙන යාමේ අරමුණින් රෝහල තුල පැවති එම තනතුරු පිරවීම අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියඇතිව සිදු කර ඇත. එම සංඛ්‍යාව 196 ක් පමණි.

	2.2.3	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාව අනුව මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.	
	2.2.4	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාව අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර හාවිතා කර නොමැති බව.	
	(අ)	රෝහල් කාර්යමණ්ඩලයට අදාල බඳවා ගැනීමේ පටිපාටි (SOR) පිළියෙල කිරීමට සුදුසු උපදේශකවරයෙකුගේ සේවාව ලබා ගැනීමේදී උපදේශකවරු තෝරා ගැනීමේ හා සේවා නියුක්ත කිරීමේ මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4, 3.5,4.2 හා 6.6.4 මාර්ගෝපදේශ අනුගමනය කර නොතිබුණි. තෝරාගෙන තිබුණු උපදේශකවරයා විසින් ඉදිරිපත් කර තිබූ කෙටුම්පත් වාර්තාව සඳහා රෝහල් කාර්යමණ්ඩලයේ හා වෘතීය සංගම්වල එකඟතාවය නොමැතිවීම හේතුවෙන් 2023 වර්ෂය වන විටත් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කළමනාකරණ මණ්ඩලයට නොහැකි වී තිබුණි.	බඳවා ගැනීමේ පටිපාටි සකස් කිරීම සඳහා උපදේශකයන් තෝරා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බඳවා ගැනීමේ පටිපාටි සකස් කිරීම සඳහා උපදේශන සේවාවක් ලබා ගැනීමට ලබා දුන්අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ප්‍රකාරව කුසලතාවයන්ගෙන් යුත්උපදේශකවරුන් තිදෙනෙක් සමඟ මේ සම්බන්ධයෙන් සාකච්ඡා කර ඇත. 1. සුමිත්අබේසිංහමහතා 2. මහාචාර්යඑම්.තිලකසිරිම හතා 3. මහාචාර්යඅජන්තාධර්මසි රිමහතා මෙහිදී සුමිත් අබේසිංහ මහතා විසින් ඔහුට ඇති අධික රාජකාරි කටයුතු නිසා ශ්‍රී ජයවර්ධනපුර මහා රෝහල සඳහා බඳවා ගැනීමේ පටිපාටි සකස් කිරීම අපහසු බව ප්‍රකාශකර ඇත.ඉන් පසුව මහාචාර්ය එම්.තිලකසිරි මහතා හා මහාචාර්ය අජන්තා ධර්මසිරි මහතාගෙන් මේ සම්බන්ධයෙන් යෝජනාවක් (Proposal) ලබා ගෙන ඇත.මෙහිදී ජ්‍යෙෂ්ඨත්වය හා මීට පෙර රාජ්‍ය ආයතන වල බඳවා ගැනීමේ පටිපාටි සකස් කිරීමේ පලපුරුද්ද සලකා බලමින් ශ්‍රී ජයවර්ධනපුර මහා රෝහලේ බඳවා ගැනීමේ පටිපාටි සකස් කිරීම සඳහා මහාචාර්ය එම්. තිලකසිරි මහතාට එම කාර්ය ලබා දීමට 2020.09.24 දින පැවති 443 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගත් තීරණය අනුව අදාල උපදේශක සේවා ලබා

			ගැනීමට කටයුතු කර ඇත. ප්‍රසම්පාදන අස්ථිත්වය පිහිටුවා ගැනීමකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩලය පනතින් තමන්ට ලැබී ඇති උක්ත බලතල ප්‍රකාරව හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට සමගාමීව උපදේශන සේවා ලබා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කර ඇත. මේ සම්බන්ධයෙන් තෝරා ගැනීමේ හා සේවා නියුක්ත කිරීමේ මාර්ගෝපදේශ සංග්‍රහයේ **4.5** මාර්ගෝපදේශය අදාල කරගෙනඇති අතර ඒ අනුව මෙම පැවරුම් මාස **06** කට වඩා අඩු බැවින් තනි පුද්ගල තෝරා ගැනීමක් (Sole-Source Selection) යටතේ තෝරා ගැනීම සිදු කර ඇත.මෙම පැවරුම් මාස **04** ක් බැවින් තරඟකාරී පදනමක් (Selection on competition) යටතේ තෝරා ගැනීම් සිදු කර නොමැත. මේ සඳහා තනි පුද්ගල තෝරා ගැනීමක් (Sole-Source Selection) යටතේ තෝරා ගැනීම් සිදුකර ඇති හෙයින් ජාතික පුවත්පත් වල දැන්වීම් පලකිරීම් සිදුකර නොමැත. කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේ කාර්යයන්ට අදාල භාවිතයන් (Terms of Reference) අනුව අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර ඇත්තේ මෙම පැවරුම් මාස **04** ක් තුල සිදු කර අවසාන කල යුතු බවයි. ඒ අනුව අදාල තෝරා ගැනීම් මාස **06** කට අඩු ව්‍යාපෘති සඳහා තෝරා ගැනීමේ ක්‍රමවේදය වන තනි පුද්ගල තෝරා ගැනීමක් (Sole-Source Selection) මත පදනම්ව තෝරා ගැනීම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදු කර ඇත. ඒ අනුව මේ සඳහා ව්‍යාපෘති යෝජනා **02** ක් ලැබී ඇත. එහිදී ජ්‍යෙෂ්ඨත්වය, මීට පෙර රාජ්‍ය ආයතන වල බඳවා ගැනීමේ පටිපාටි සකස් කර තිබීමේ පලපුරුද්ද හා ඒ සඳහා ඇති විශෙෂඥ හැකියාව සලකා බලා මෙම ව්‍යාපෘතිය මහාචාර්ය එම් තිලකසිරි මහතාට ලබා දීමට අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කර ඇත. මෙම තීරණය ප්‍රධාන ගණන් දෙමේ නිළධාරියා වෙත අමාත්‍යාංශ ලේකම් වෙත යහපාලනය සඳහා පොදු ව්‍යවසාය මාර්ගෝපදේශයට (Public Enterprises Guidelines for Good Governance) අනුව යවා ඇති අතර ඒ සඳහා විරෝධතාවයක් පල කර නැත.

			මෙම කාර්ය සඳහා යොමු කිරීමේ කොන්දේසි (Terms of Reference) පමණක් සකස් කර ඇති අතර පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණි. මෙම බදවා ගැනීමේ පටිපාටි සකස් කිරීම සඳහා යන විශේෂඥ පිරිවැය සම්බන්ධයෙන් අවබෝධයක් ආයතනය සතු නොවුණි. අධ්‍යක්ෂ මණ්ඩලය මෙම තීරණය ලබා දුන් දින අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වන භාණ්ඩාගාර නියෝජිතවරයා ද සහභාගී වී තිබූ අතර මේ සඳහා ඔහු විසින් මේ සම්බන්ධයෙන් විරුද්ධතාවයක් අධ්‍යක්ෂ මණ්ඩලයේදී ඉදිරිපත් නොකෙරුණි. තෝරා ගැනීමේ හා සේවා නියුක්ත කිරීමේ මාර්ගෝපදේශ සංග්‍රහයේ **6.6.4** මාර්ගෝපදේශය පරිදි ගිවිසුම් ගත කොන්ත්‍රාත් මුදලින් උපරිම **20%** ක් දක්වා අත්තිකාරම් ගෙවිය හැකි වුවත් රෝහල උපදේශක සමඟ **2020** ඔක්තෝබර් **07** දින ඇති කරගෙන තිබූ ගිවිසුම් ප්‍රකාරව ගිවිසුම්ගත මුදලින් **25%** ක් අත්තිකාරම් ලෙස ගෙවීමට කටයුතු කර ඇත. බදවා ගැනීමේ පටිපාටි සකස් කිරීම සඳහා තෝරා ගත් උපදේශකවරයා සමඟ සාකච්ඡා කර මෙම මුදල ගෙවීමට එකඟ වී ඇත.
	(ආ)	**2021** සැප්තැම්බර් **16** දින රු.මිලියන **2.08** ක් වැය කරමින් ශ්‍රී ජයවර්ධනපුර මහා රෝහල විසින් ABP Monitoring System එකක් ප්‍රසම්පාදනය කර තිබුණු අතර මෙම ප්‍රසම්පාදනයට ලංසු ඉදිරිපත් කර තිබුණු ලංසුකරුවන් වෛද්‍ය උපකරණ සැපයීමට අදාලව ජාතික ඖෂධ හා නියාමන අධිකාරියේ ලියාපදිංචිය ඉදිරිපත් කර නොතිබුණි. තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය අනුව ඉහත ලියාපදිංචිය පසුව ලබා ගැනීමේ කොන්දේසියට යටත්ව වැඩිම මිල ලංසුව සඳහා **2021** මැයි **20**දින ප්‍රසම්පාදනය පිරිනමා තිබුණද, ඖෂධ හා වෛද්‍ය උපකරණ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ **2.1** හා **2.2** මාර්ගෝපදේශ ප්‍රකාරව එම ලියාපදිංචිය **2022** මාර්තු **15** වගණිත දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.	මෙම ප්‍රකාශය සමඟ එකඟ වෙමි. මෙම ප්‍රසම්පාදන ගොණුව පරීක්ෂාකිරීමේදී ලංසුකරුවන් තිදෙනෙක් ලංසු ඉදිරිපත්කර තිබූ අතර ඔවුන්ගේ විස්තර ඇතුලත්ව පිළියෙල කර ඇති පත්‍රිකා තුල කිසිදු ලංසුකරුවෙකුNMRA සහතිකයේ පිටපතක් ලබාදී නොමැති බව සඳහන් වේ. නමුත් ඇණවුම් ලබාදී ඇති ලංසුකරු NMRA අනුමැතියේ පිටපතක් ගොණුව තුල දක්නට ලැබුනද එහි සඳහන් අයිතමය වෙනස් නාමයකින් ඇත. කෙසේ වෙතත් මේ සඳහා ISO සහතිකයක් ඇත. ඒ මත පදනම්ව මිලදී ගෙන ඇත. තවද අදාල නිර්දේශ සහ ටෙන්ඩර් මණ්ඩල අනුමැතිය ලැබී ඇත්තේ NOL හෝ NMRA සහතිකයේ පිටපතක් සමඟ

			භාණ්ඩ සැපයීම සඳහාය.එය අදාල ඇණවුමේදි සඳහන් කර තිබේ. නමුත් භාණ්ඩ භාර ගැනීමේදි මේ පිළිබඳ අවධානය යොමුව නොමැති අතර GRN නිකුත් කර තිබේ. එම GRN පදනමව අදාල භාණ්ඩ රෝහල විසින් භාවිතයට ගෙන ඇති අතර ඒ අනුව පටිපාටියේ අනෙකුත් පියවර ක්‍රියාත්මක කර තිබේ.
	(ඇ)	රෝහලේ Harmonic Piece 08ක් මිලදී ගැනීම සඳහා අදාල සැපයුම්කරු උපාංගයක් රු.933,900 බැගින් උපාංග 8ක් සඳහා රු.මිලියන 7.47 ක ලංසුවක් ඉදිරිපත් කර තිබුණි. 2020 නොවැම්බර් 17 දින පවත්වන ලද තාක්ෂණික ඇගයීම් කමිටුවේදී මෙම උපාංගයෙන් ඒකක 02ක් පමණක් මිලදී ගැනීමටත් නිර්දේශ කර තිබුණද ප්‍රසම්පාදන කමිටුව එම නිර්දේශ නොසලකා කටයුතු කර තිබුණි. ටෙන්ඩරය ඉදිරිපත් කිරීමේදී දින 3ත් 5ත් අතර සැපයිය හැකි බව ටෙන්ඩර්කරු දක්වා තිබුණු අතර ටෙන්ඩර් කොන්දේසි පරිදි මෙම ඇණවුම යනි 08ත් 10ත් අතර කාලයක් තුළ සම්පූර්ණ කළ යුතු වුවත් අදාල උපාංග අතුරින් 03ක් පමණක් නියමිත කාලපරිච්ඡේදය තුළදී ලැබී තිබුණි. ඉතිරි උපාංග 03ක් යනි 05 සිට යනි 54 අතර කාලයක් ප්‍රමාද වී තිබුණද ටෙන්ඩර් කොන්දේසි 26.1 පරිදි අය කළ යුතු රු.280,170ක ප්‍රමාද ගාස්තුවක් අයකර නොතිබුණි. එසේම ටෙන්ඩර් කොන්දේසි 14.5 පරිදි ටෙන්ඩරය සම්පූර්ණ වනතුරු ටෙන්ඩරයේ ඉදිරිපත් කළ මිල ගණන් වෙනස් කළ නොහැකි වුවද එම කොන්දේසිවලට පටහැනිව මෙම ටෙන්ඩරයේ එක් වෛද්‍ය උපාංගයක් ටෙන්ඩරයේ සඳහන් මිලට වඩා රු.644,391 ක් වැඩි මිලකට එනම් රු.මිලියන 1.58 මිලකට ටෙන්ඩරය සම්පූර්ණ කළ යුතු කාලයට වඩා යනි 81ක් ඉක්මවීමෙන් සපයා තිබුණු අතර ටෙන්ඩර් කොන්දේසි ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අයකිරීමට කටයුතු කර නොතිබුණි.	මෙම Harmonic Hand Piece මිලදී ගනු ලැබුවේ අදාල යන්ත්‍රය සමඟ භාවිතා කිරීම සඳහාය.මෙම මිලදී ගැනීම් අදාල උපකරණය සැපයීම් කල සැපයුම්කරුගෙන්ම මිලදී ගත යුතුය. ඒ අනුව වාර්ෂිකව අවශ්‍ය ප්‍රමාණය මත මිල ගණන් කැඳවූ තාක්ෂණික කමිටු නිර්දේශ ලබා දී ඇත්තේ එම උපාංග2ක් සඳහා වන අතර ඒකකයක මිල සැපයුම්කරුගේ ලංසුවේ සඳහන් මිල නොවන බව පෙනී ගොස් ඇත. නමුත් තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය අදාල ලංසුවේ නිර්දේශය ලෙස සලකා ප්‍රසම්පාදන කමිටුව මෙම මිලදී ගැනීම් අනුමත කර ඇත.නමුත් අනුමත කිරීම් නියමිත ඒකක ප්‍රමාණය සහ නියමිත ලංසුව අනුව ලබා දී තිබේ. මේ අනුව තාක්ෂණික ඇගයීම් කමිටුව මීට පෙර ලබාදුන් නිර්දේශයක් නැවත ලබාදී ඇති බව පෙනේ. එය ඔවුන්ගෙන් සිදු වී ඇති වරදක් බව පිළිගනිමි. තවද අදාල ටෙන්ඩර් කොන්දේසි අනුව එම ඒකක 8ම එකවර ලබා ගැනීම සිදු කල යුතු විය. නමුත් මෙම මිලදී ගැනීම් අවස්ථා කීපයකදී සිදුව ඇත. මේ පිළිබඳ විමසීමේදී දැනගත හැකි වුයේ අදාල ඒකක එකවර අවශ්‍ය නොවන බවත් වර්ෂය පුරා භාවිතය සඳහා අවශ්‍ය බැවින් අවශ්‍යතාවය මත ලබා ගත් බවය. එය මුදල් ගෙවීමේ පහසුව සඳහාද ඉවහල් විය. එකවර සියළු ඒකක ලබා ගන්නේ නම් ඒ සඳහා එකවර මුදල් ගෙවීම් ගැටළුවක් විය හැකිව තිබුණි. කෙසේ වුවද මෙම උපකරණයේ උපාංග 8න් එකක් ලබා ගෙන ඇත්තේ 2022 වසරේ සැප්තැම්බර් මාසයේදීය. මෙම කාලයේදී ලංකාව මුහුණදුන් ආර්ථික

			අවපාතය මත එම ඒකකය අදාල මිලට ලබාදිය නොහැකි බව දැනුම් දුන් අතර මෙය රටේ පැවති තත්වය මත සිදුවී ඇති බැවින් ටෙන්ඩර් කොන්දේසි අනුව කටයුතු කල නොහැකි වී තිබේ. ඒ අනුව එය "Force Major" තත්වය යටතේ තාක්ෂණික කමිටු නිර්දේශ මත ටෙන්ඩර් මණ්ඩල අනුමැතිය යටතේ නව මිලට මිලදී ගෙන තිබේ.
	(ඇ)	2007 ඖෂධ හා වෛද්‍ය උපාංග ප්‍රසම්පාදනය සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 මාර්ගෝපදේශය අනුව හදිසි ප්‍රසම්පාදන අවස්ථාවලදී හැර අනෙකුත් ප්‍රසම්පාදන අවස්ථාවලදී අදාල තාක්ෂණික කමිටුවට සෞඛ්‍ය අමාත්‍යාංශයේ නියෝජිතයෙක් (අධ්‍යක්ෂ තරාතිරමට පහල නොවන), රාජ්‍ය ඖෂධ සංස්ථාවේ නියෝජිතයෙක් (අධ්‍යක්ෂ තරාතිරමට පහල නොවන), අවම වශයෙන් අදාල ක්ෂේත්‍රෙය් යාමාජිකයින් පත්කළ යුතු වුවත් නියැදි පරීක්ෂාවට අනුව අවස්ථා 05කදී එකතුව රු.මිලියන 50.82ක් වූ ඖෂධ හා වෛද්‍ය උපාංග ප්‍රසම්පාදනයේදී නිර්දේශිත නියෝජිතයින් තාක්ෂණික කමිටුවට පත් කිරීමට කටයුතු කර නොතිබුණි.	ශ්‍රී ජයවර්ධනපුර රෝහල ඇඳන් 1067 කින් යුක්ත විශේෂ ශික්ෂණ රෝහලකි. මෙහිදී මිලදී ගැනීමේ අවශ්‍යතාවය කොටස් 2කට බෙදා දැක්විය හැකිය. 1. ප්‍රාදේශීය ටෙන්ඩර් මණ්ඩල මිලදී ගැනීම රු. මි. 25 දක්වා 2. දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩල මිලදී ගැනීම රු.මි. 25-200 දක්වා රෝහලේ සිදුවූ බෙහෝ මිලදී ගැනීම් රු.මි. 25 ට අඩු මිලදී ගැනීම් වේ. මෙම මිලදී ගැනීම් වලට තාක්ෂණික ඇගයීම් කමිටු පත් කිරීමේ දී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.5 ට අනුව මෙවන තෙක් ක්‍රියා කොට ඇත. දැනට අනෙක් විශේෂ ශික්ෂණ රෝහල්වල සිදුවන ක්‍රියාදාමය වන්නේ ප්‍රාදේශීය ටෙන්ඩර් මණ්ඩලවලට අදාල තාක්ෂණික ඇගයීම් කමිටු නිලධාරීන් පත්කර ගැනීමත් මිලකැඳිවීමෙන් පසු එම මිල ගණන් ප්‍රාදේශීය ටෙන්ඩර් මණ්ඩලවල සීමාව ඉක්මවා යන විට එය දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයට යොමු කොට අනුමැතිය ලබා ගැනීමයි. ශ්‍රී ජයවර්ධනපුර රෝහලේ කටයුතු කාර්යක්ෂමව සහ පෞද්ගලික අංශය සමඟ තරඟකාරිත්වයක් පවත්වාගෙන යාමේදී අරමුණු වන මෙම ක්‍රියාවලිය පවත්වාගෙන ගොස් ඇත. කෙසේ වුවද මීන් ඉදිරියට සිදුවන ප්‍රසම්පාදනයන් සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (ප්‍රසම්පාදන) උපදෙස් ලබාගෙන ඒ අනුව කටයුතු කිරීමට ක්‍රියා කරමි. මේ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත.

	2.3	වෙනත් කරුණු	
	(අ)	2016 වර්ෂයේදී රජයේ ප්‍රාග්ධන ප්‍රතිපාදන යටතේ රෝහලේ පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීමට සැලසුම් කර තිබුණු අතර 2017 නොවැම්බර් 22 දින රු.මිලියන 154.56 ක මුදලකට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය විය.	
	i.	2020 දෙසැම්බර් 30 දිනෙන් පසුව රෝහල විසින් වරින් වර පෙන්වා දෙන ලද අඩුපාඩු සකස් කිරීමෙන් අනතුරුව ගොඩනැගිල්ලෙහි සියලුම කටයුතු සම්පූර්ණ කළ බව, 2021 මැයි 18 දින සිට 2021 දෙසැම්බර් 14 දින දක්වා අවස්ථා කිහිපයකදීම උපදේශක ආයතනය විසින් රෝහල වෙත දැනුම් දී තිබුණි. 2022 මාර්තු 18 දින ගොඩනැගිල්ල භාර ගැනීම රෝහල විසින් සිදු කර තිබුණද 2023 පෙබරවාරි මාසය වන විටත් පරිපාලන ගොඩනැගිල්ල අදාල අරමුණට භාවිතා නොකර නිශ්කාර්යව පැවතුණි.	උපදේශක ආයතනය වූ ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් ඉහත ගොඩනැගිල්ල සම්පූර්ණ කර බව දැනුම් දීමෙන් පසු ගොඩනැගිල්ල පරීක්ෂාකර භාර ගැනීම සඳහා කමිටුවක් පත් කරන ලදි. මෙම කමිටුව උපදේශක ආයතනය වන ගොඩනැගිලි දෙපාර්තමේන්තුව හා කොන්ත්‍රාත් සමාගම සමඟ වරින් වර පෙන්වා දෙන ලද අඩුපාඩු සම්පූර්ණ කර ඇති ආකාරය පරීක්ෂා කරන ලදි. එහි දී වායු සමීකරන පද්ධතියේ වූ දෝෂයක්, පිටත කාණු පද්ධතිය හා පිටත බිම් සකස් කිරීම සම්පූර්ණ කර නොතිබූ බැවින් භාර ගැනීම සිදු නොවිණි. එලෙසම රටේ පැවති කොවිඩ් 19 වසංගත තත්වය නිසා P.C.R. පරීක්ෂණ 1500 ක් පමණ කිරීමට හා කොවිඩ් රෝගීන් සඳහා මෙම ගොඩනැගිල්ල වරින්වර රෝහල විසින් භාවිතා කල අතර මසකට රු.මි.45-50 අතර ආදායමක් ලබා ගන්නා ලදි. එසේම අවට ප්‍රජාව මෙතුලින් විශාල ප්‍රතිලාභ ලබා ගන්නා ලදි. එම අවස්ථාවලදි කොන්ත්‍රාත් සමාගමට අඩු පාඩු සම්පූර්ණ කිරීමට නොහැකි වූ අතර රටේ පැවති පද්ධති උපාංග හිඟකම හා ඒවා මිලදී ගැනීමට නොහැකි වීම නිසා අඩුපාඩු සම්පූර්ණ කිරීමට කල් ගත විය. වරින් වර රටේ පැවති කොවිඩ් 19 වසංගත තත්වය, හා ඉදිකිරීම් ක්ෂෙත්‍රය තුල තිබූ කඩා වැටීම නිසා කොන්ත්‍රාත් සමාගමට ඉහත අඩුපාඩු සම්පූර්ණ කිරීමට කල් ගත විය. එම කමිටුව මඟින් 18/03/2022 දින ගොඩනැගිල්ල පරීක්ෂාකර භාර ගන්නා ලදි. ගොඩනැගිල්ලේ ඉදිකිරීම් හා උපාංග සවිකර නිම කිරීමෙන් පසුව රටේ පැවති

			කොවිඩ් 19 වසංගත තත්වය යටතේ රෝගී තත්වයට ලක්වූ රෝහල් සේවකයින්ගේ භාවිතයට හා PCR පරීක්ෂණ ඒකකයක් මෙම ගොඩනැගිල්ලේ පවත්වාගෙන යන ලදි. අවස්ථා කීහිපයකදීම මේ ආකාරයට ගොඩනැගිල්ල හැකි උපරිමයෙන් භාවිතා කල අතර ඒ කාලය තුල ගොඩනැගිල්ලේ උපකරණ භාවිතයට ගන්නා ලදි. ඉදිරියේදී ගොඩනැගිල්ල අදාල අරමුණු සඳහා භාවිතා කිරීමට කටයුතු කෙරේ.
	ii.	ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ සහතික කිරීම් පරිදි මෙම කොන්ත්‍රාත්තුවේ වියදම රු.මිලියන **168.44** ක් වී තිබුණු අතර කොන්ත්‍රාත්තුවේ මිල වීවලනය වූ රු.මිලියන **13.88** ක ප්‍රමාණය කොන්ත්‍රාත් පිරිවැයෙන් සියයට **8.98** ක් ලෙස ගණනයේදී ගොඩනැගිල්ලේ මූලික ඇස්තමේන්තුවල සඳහන් ශ්‍රවණාගාරය වායුසම්කරණය නොකිරීම, ශ්‍රවණාගාරයේ බිමට ටයිල් ඇතිරීම සිදු නොකිරීම යන කාර්යයන් ඉටු නොවීම පිළිබඳව සැලකිල්ලට ගෙන නොතිබුණි.	මෙම කොන්ත්‍රාතුව අමාත්‍යාංශ ටෙන්ඩර් මණ්ඩලයෙන් අනුමතවූ කොන්ත්‍රාතුවකි. මෙම ඉදිකිරීම කර ගෙන යන අතරතුරදී පැන නැඟුනු වායු සම්කරණ පද්ධතිය සම්බන්ධව වූ ගැටළුව සඳහා උපදේශන සමාගම වන ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් ලබා දුන් උපදෙස් මත අදාල අමාත්‍යාංශ තාක්ෂණික ඇගයීම් කමිටුව නිර්දේශ ලබා දී ඇත. මෙහිදී ඔවුන්ගේ මූලික අවධානය යොමු වී ඇත්තේ වායු සම්කරණ පද්ධතිය සඳහා පමණි.
	iii.	**2020** ඔක්තෝබර් **21** දිනැති අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු තීරණයට අනුව කොන්ත්‍රාත් මිල වීවලනයට **2006** ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ **8.13.4** ප්‍රකාරව අනුමැතිය ලබා ගෙන නොතිබුණි.	මෙම මිල වීවලනයට අදාල අනුමැතිය ලබා ගැනීම සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගෙන් අනුමැතිය ලබා ගත හැකි බව ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ **8.13.4** දක්වා තිබීම මත අදාල අනුමැතිය ලබා දෙන ලෙස රෝහල් සභාපතිගෙන් **2019.08.05** දින ඉල්ලීම් කර ඇත. එහිදී රෝහල් මණ්ඩල තීරණයට යටත්ව අදාල කාර්යන් කර ගෙන යන ලෙස පූර්ව අනුමැතිය ලබා දී ඇත. නමුත් රෝහල් මණ්ඩලය එම තීරණ අනුමත කර ගැනීම සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත යොමු කරන ලෙස දන්වා ඇත. ඒ අනුව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටුවට ඉදිරිපත් කරන ලෙසත් එය තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ සහිතව ඉදිරිපත් කරන ලෙසත් දන්වා තිබූ බැවින් ඒ අනුව කටයුතු සිදු කර තිබේ. නමුත් අමාත්‍යාංශ ප්‍රසම්පාදනය කමිටු තීරණය වී ඇත්තේ **10%** සීමාව තුල පවතින ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කරන ලෙසය. මෙම තීරණය අනුමැතියක් ලෙස සලකා කටයුතු කර ඇති බව පිළිගනිමි. මේ

			සම්බන්ධයෙන් අදාල පාර්ෂවයන් වෙත යොමුකර නියමිත අනුමැතීන් ලබා ගැනීමට කටයුතු සිදු කර තිබේ.
	(ආ)	රෝහලේ වැඩහල සහ උද්‍යාන පවිත්‍ර කිරීමේ කාර්ය මණ්ඩලය සඳහා කාර්යාල පවත්වා ගෙන යාම සඳහා තෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවෙකු වෙත රු.මිලියන **87.02**ක (වැට රහිත) මුදලකට **2016** නොවැම්බර් **09** දින කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය විය.	
	i.	ගොඩනැගිල්ල ඉදිකිරීමට අවශ්‍ය උපදේශන සේවාව ලබා ගැනීමේදී ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය අනුගමනය නොකර අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදි මධ්‍යම ඉංජිනේරු කාර්යාංශය තෝරා ගෙන තිබුණි. කොන්ත්‍රාත් වටිනාකමින් සියයට **8** ක් හෙවත් රු. මිලියන **6.96** ක් උපදේශන සේවා සඳහා ගෙවීමට එකඟ වී තිබුණු අතර එම අගය රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට සාපේක්ෂව රු. මිලියන **3.48** කින් හා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට සාපෙක්ෂව රු.මිලියන **2.61** කින් වැඩි අගයක් ගෙන තිබුණු බව නිරීක්ෂණය විය.	මෙම කාලසීමාව තුල රෝහල ඉදිකිරීම ව්‍යාපෘති කිහිපයක් ආරම්භ කිරීමට සැලසුම් කර තිබී ඇත. ඒ අනුව එක් ආයතනයකට එම සියළුම ව්‍යාපෘති සඳහා උපදේශනය ලබා දුන්නේ නම් නියමිත කාලයක් තුල මෙම ව්‍යාපෘති ආරම්භ කිරීම අසීරු වන බැවින් සහ අදාල මූල්‍ය ප්‍රතිපාදන ප්‍රයෝජනයට ගත යුතු වූ බැවින් රාජ්‍ය ආයතන **3**ක් වන රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව ,මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය සහ ගොඩනැගිලි දෙපාර්තමේන්තුව සඳහා ව්‍යාපෘති ලබා දී ඇත. ඒ අනුව රෝහල් මණ්ඩලය මෙය අනුමත කර ඇත. කෙසේ වුවද ඔවුන් විසින් අය කරනු ලබන ගාස්තු ප්‍රතිශතයන් වෙනත් අගයන් ගෙන ඇත. ඒ අනුව CECB ආයතනයේ ගාස්තු වැඩි බව පෙනේ.
	ii.	ICTAD ආයතනය විසින් නිකුත් කළ ඉදිකිරීම් ටෙන්ඩර් පිළිබඳ සම්මත ලංසු ලියවිලි අනුව ප්‍රමාද ගාස්තු වශයෙන් මුළු කොන්ත්‍රාත් පිරිවැයෙන් දිනකට **0.05**ක් හා උපරිමය සියයට **10**ක් දක්වා අය කළ හැකි වුවද, කොන්ත්‍රාත් ගිවිසුමට එය සියයට **0.05**ක් හා උපරිමය සියයට **5**ක් වශයෙන් ඇතුළත් කර තිබීම හේතුවෙන් රු.මිලියන **4.35** ක ප්‍රමාද ගාස්තුවක් රෝහලට අහිමිවී තිබුණි.	උපදේශන ආයතනය ලංසු ලේඛන සකස් කර ඇත්තේ ICTAD ආයතනය විසින් නිකුත් කල ලංසු ලේඛන පදනම් කර ගෙනය. එය තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ සහ ප්‍රසම්පාදන කමිටු අනුමැතිය යටතේය. ඒ අනුව මෙය ක්‍රියාත්මක කර ඇත. එහිදී උපදේශන ආයතනය ප්‍රමාද ගාස්තු ලෙස **5%** ප්‍රමාණයක් දක්වා ඇති අතර එය තාක්ෂණික ඇගයීම් කමිටු හා ප්‍රසම්පාදන කමිටුව අනුමත කර ක්‍රියාත්මක කර ඇත.
	iii.	ගොඩනැගිල්ල ඉදිකිරීම ආරම්භයේදී වැඩහල පැවති ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීම හේතුවෙන් මසකට රු.**257,000** ක මුදලකට කන්ටේනර් **12**ක් කුලියට ගෙන තිබුණි.	මෙම ප්‍රකාශය අනුව අතිරේක කුලී වියදමක් කන්ටේනර් සඳහා දැරීමට සිදුවූ බව පිළිගනිමි. මෙම කොන්ත්‍රාත්තුවට අදාල ලංසුපත්

		ගිවිසුම් ප්‍රකාරව 2018 අප්‍රේල් මාසය වන විට ඉදිකිරීම් කටයුතු අවසන් නොකිරීම හේතුවෙන් 2022 සැප්තැම්බර් 30 දිනට මාස 52ක් වෙනුවෙන් රු.මිලියන 13.36 ක අතිරේක කුලී වියදමක් දැරීමට සිදු වී තිබුණි. කොන්ත්‍රාත්කරුගේ මූල්‍ය හැකියාව පිළිබඳව පරීක්ෂා කිරීමකින් තොරව කොන්ත්‍රාත්කරු තෝරා ගෙන තිබුණු බවද නිරීක්ෂණය විය.	තාක්ෂණික ඇගයීම් කමිටුව උපදේශන ආයතනයේද සහය ඇතිව ඇගයීම් කර නිර්දේශ ලබා දී ඇත. එය ප්‍රසම්පාදන කමිටුව විසින් ද අනුමත කර තිබේ. ඒ අනුව කොන්ත්‍රාත්කරුගේ මූල්‍ය තත්වය පිළිබඳව ද සලකා බැලීමක් සිදු කර නිර්දේශ ලබා දීමක් සිදු වන්නට ඇත. අදාල කොන්ත්‍රාත්කරු නියමිත කොන්ත්‍රාත්තුව ආරම්භයේ නියමිත පරිදි සිදු කර ඇති බව පෙනේ. නමුත් ඔවුන් පසුව අසාර්ථක වී ඇත. කෙසේ වුවද අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් අවස්ථා කිපයකදී මේ සම්බන්ධව අවධානය යොමුකර තීරණ ගෙන ඇත. මේ වන විට අයකර ගත හැකි ප්‍රමාද ගාස්තු අය කර ගෙන ඇති අතර කොන්ත්‍රාත්කරුද ඉදිකිරීම් සිදුකරමින් පවතී. මෙහිදී ඔවුන්ට ගෙවනු ලබන්නේ මූලික ලංසුවේ සඳහන් අගයන් පදනම් කර ගෙන බැවින් රෝහලට එය සහනයකි. පසුගිය වසර කීපය තුල රට තුල සිදුවූ වසංගත හා ආර්ථික තත්වයන් මත මෙහි නිමකිරීම ප්‍රමාද වී ඇති බව පිළිගනිමි. මේ වනවිට නිමකිරීම මටටමේ පවතින බැවින් ඉදිරි සති කීපය තුල කන්ටෙනර් කීපයක් නිදහස් කිරීමේ හැකියාව පවතින අතර ඒ සඳහා සැලසුම් සකස් කර ක්‍රියාත්මක කරමින් පවතී.
	(ඇ)	රෝහලේ සම්පත් යොදාගෙන රාජකාරී වේලාවෙන් බැහැරව කරන පෞද්ගලික ප්‍රතිකාර සම්බන්ධයෙන් විශේෂඥ වෛද්‍යවරුන්ගේ අභිමතය පරිදි රෝගීන්ගෙන් වෘත්තීය ගාස්තු අයකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.	
	i.	රෝහලේ සම්පත් යොදාගෙන රාජකාරී වේලාවෙන් පරිභාහිරව කරන ශල්‍යකර්ම හා පරීක්ෂණ සඳහා සම්මත ප්‍රමිතියකින් හෝ නිශ්චිත ප්‍රතිපත්තියකින් තොරව විශේෂඥ වෛද්‍යවරුන්ගේ අභිමතය පරිදි අයකරන ගාස්තු තීරණය කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුලදී සිදු කරන ලද ශල්‍යකර්ම හා පරීක්ෂණ වෙනුවෙන් වෘත්තීය ගාස්තු ලෙස රු.1000 සිට රු.120,000 දක්වා වූ පරාසයක මුදල් අයකර තිබුණි.	දැනට හඳුන්වා දෙනු ලබන පැකේජ ක්‍රමය තුලින් මෙම තත්වය මඟහැරී යනු ඇත.

	ii.	1948 ජූලි 18 දිනැති අංක අමප/1984/335(2) දරණ අමාත්‍ය මණ්ඩල තීරණය සහ 2000 නොවැම්බර් 15 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ප්‍රකාරව සාමාන්‍ය රාජකාරී වේලාව තුළ ගෙවන වාට්ටු වල රෝගීන් සඳහා සිදු කරන ශල්‍යකර්ම වෙනුවෙන් වෘත්තීය ගාස්තු අය කළ නොහැකි වුවද, සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවට අනුව 2021 වර්ෂයේ අවස්ථා 14 කදී සාමාන්‍ය රාජකාරී වේලාව තුළ සිදු කර තිබුණු ශල්‍යකර්ම වෙනුවෙන් රු.මිලියන 2.33 ක් වෘත්තීය ගාස්තු ලෙස අය කර තිබුණි. මේ සම්බන්ධයෙන් හෘද සැත්කම් ශල්‍යාගාරයේ (CTOT) ශල්‍යාගාර ලේඛන පරීක්ෂාවේදී රෝහල් අධ්‍යක්ෂකගේ අනුමැතිය මත සාමාන්‍ය කාලය තුළ ශල්‍යාගාරය භාවිතා කර තිබුණු අතර එම ලේඛනයේ ශල්‍යකර්ම සිදු කළ වේලාව දක්වා නොතිබුණු අවස්ථාද විය.	හෘද ශල්‍යාගාරයේ හෘද සැත්කම් පිළිබඳ තොරතුරු පොදුවේ සටහන් කිරීම සඳහා පොදු SJGH Operation Register එකක් ඇත. ඊට අමතරව හෘද ශල්‍යකර්ම කරන අතරතුර සටහන් කිරීමට සාමාන්‍ය හෘද සැත්කම් හා ගෙවන වාට්ටුවල හෘද සැත්කම් සඳහා වෙන වෙනම පොත් 2ක් තබා ඇත. පොදු Operation Register හී දිනය,වේලාව,රෝගියාගේ නම ,BHT අංකය ඇතුළු සියළුම දේ පැහැදිලිව දින පිලිවෙලට සටහන් තබා ඇත. නමුත් මෙම විගණන පරීක්ෂණය සඳහා විගණන අංශයට ගෙවන වාට්ටු වල හෘද සැත්කම් සටහන් කරන පොත පමණක් භාර දී ඇත. මේ පිළිබඳ පරීක්ෂාව සඳහා පොදු Operation Register එක ද ඉදිරිපත් කල හැකිය. සාමාන්‍ය රාජකාරී කාලය තුල පෞද්ගලික රෝගීන්ගේ සැත්කම් සිදු කිරීම.(ශල්‍ය කර්ම 6ක් සම්බන්ධව පමණි.) 1. ශල්‍ය කර්ම 1ක් සඳහා එකඟ නොවෙමි. BHT අංක 2123675 දරණ W.M.L. කුමාර රෝගියාගේ හෘද සැත්කම් 2023.11.06 වන සෙනසුරාදා දින දවල් 12.55ට සිදු කර ඇත. 2. Mr.D.T.Ranjith – 2212152 3. Mr.D.D.N.Chandrasiri – 2218055 4. Mr.P.S.KahandaSumithra – 2215182 5. Mr.H.M.A.Bandara – 1922011 6. Mr.R.Devaraja – 2209457 මෙම ශල්‍යකර්ම 5 සිදුකර ඇත්තේ රටේ එවකට පැවති දැඩි දුෂ්කර කාලසීමාවකදීය. මෙහි දී පැවති ඉන්ධන අර්බුදය නිසා අත්‍යාවශ්‍ය රෝහල් සේවකයන් වන අපට රාජකාරියට පැමිණීමට හා නැවත නිවෙස් බලා යාමට අපහසු කරුණක් වුයේ පොදු මෙන්ම පෞද්ගලික ගමනා ගමනයද අඩපන වූ නිසාවෙනි. මෙවන් තත්වයක් යටතේ හෘද ශල්‍යාගාරයේ රාජකාරී කටයුතු අවලංගු නොකොට හෘද රෝගීන්ගේ රෝගී සත්කාරයට බාධා නොවන අයුරින් මෙම ශල්‍යකර්ම සිදු කරන ලදී.

	iii.	විශේෂඥ වෛද්‍යවරුන් සිය රාජකාරී වේලාවෙන් පසු සිදුකරනු ලබන ශල්‍යකර්ම හා පරීක්ෂණ සඳහා මහාරෝග්‍යශාලා මණ්ඩලය විසින් මාසිකව රු.518,418 ක් පමණ පොදුකාර්ය පිරිවැය ලෙස වැය කරන බව හඳුනාගෙන තිබුණද 201 වර්ෂය තුළදී කාර්යමණ්ඩලය වෙත ගෙවා තිබුණු මුළු වෘත්තීය ගාස්තු රු.මිලියන 388 කින් මණ්ඩලයේ ආදායමට බැර කර තිබුණු මුළු සේවා ගාස්තුව රු.583,035ක් පමණක් විය. සේවා ගාස්තුව වැඩි කිරීම සම්බන්ධයෙන් 2019 සැප්තැම්බර් 25 දින අධ්‍යක්ෂ මණ්ඩලයට යෝජනා ඉදිරිපත් කර තිබුණු නමුත් සත්‍ය වශයෙන් වැයකරන පොදුකාර්ය පිරිවැයට සාපේක්ෂව අය කරන සේවා ගාස්තුව වැඩි කර ගැනීමට මෙතෙක් අපොහොසත්වී තිබුණි. ඒ අනුව 1999 වර්ෂයේ සිට ක්‍රියාත්මකව පවත්නා වෘත්තීය ගාස්තුවෙන් සියයට 0.15 ක සේවා ගාස්තුවක් පමණක් අයකර ගැනීමේ ක්‍රමවේදය සමාලෝචිත වර්ෂය දක්වා පවත්වාගෙන තිබුණද කාලානුරූපීව අවශ්‍ය සංශෝධනයන් කිරීමට රෝහල් පාලනාධිකාරිය කටයුතු කර නොතිබුණි.	වෘත්තීය ගාස්තු අයකිරීම සඳහා විශේෂඥ වෛද්‍යවරු විසින් පෞද්ගලික වෛද්‍ය සේවයේ යෙදෙන අතර ඒ සඳහා රෝහලේ විශේෂ වාට්ටු වෙන් කර ඇත. ඒ අනුව එම ගෙවන වාට්ටු වන 03, 04 සහ 05 යන වාට්ටුවලට රෝගීන් ඇතුලත් වීම සිදුවේ.මේ වන විට එම වාට්ටු වල ඇඳන් 100%ක්ම උපයෝජනයෙහි පවතී. මෙහිදී ගෙවන වාට්ටු වල කාමරයකට හෝ ඇඳකට වෙනම අය කරන ගාස්තුවට (රු 2,000/-, රු 3,000/-, රු 5,000/-, රු 7,500/-) අමතරව රෝහලෙහි සාමාන්‍ය වාට්ටු වලට (10%) වඩා මෙම වාට්ටුවේදී රෝගීන්ට ලබාදෙන සේවාවන් සඳහා 30% ක ලාභ ප්‍රතිශතයක් තබා ගනිමින් රෝහල විසින් ගාස්තු අයකරනු ලබයි. ඒ අනුව රෝහල් ගාස්තු, ඖෂධ හා පාරිභෝජන ද්‍රව්‍ය, ශල්‍යකර්ම ගාස්තු, පරීක්ෂණ ගාස්තු යනාදිය වෙනුවෙන් රෝහලට ඉහළ අදායමක් ලැබේ. ඊට අමතරව වෘත්තීය ගාස්තු වලින් 0.15% ක ගාස්තුවක් ද රෝහලට අයකරනු ලැබේ. පෞද්ගලික අංශයේ රෝහල් වල මෙවැනි ගාස්තුවක් හෝ අය නොකරන බව සඳහන් කරමින් මේ සම්බන්ධයෙන් පසුගිය කොප් කමිටු රැස්වීමේ දී විශේෂඥ වෛද්‍යවරුන් විසින් දිර්ඝ වශයෙන් පැහැදිලි කිරීම් ලබා දෙන ලදී.
	iv.	අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත සහායක වෛද්‍ය හා අනෙකුත් කාර්යමණ්ඩලය සඳහා 2021 වර්ෂයේදී වෘත්තීය ගාස්තු රු.මිලියන 76.91 ක් ගෙවා තිබුණි.	අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කටයුතු කිරීමට අදාල ක්‍රියාමාර්ග ගනිමින් පවතී.
	v.	රෝහල් කාර්යමණ්ඩලයට අයත් නොවන බාහිර වෛද්‍යවරුන් 04 දෙනෙකු විසින් 2021 වර්ෂය තුළ දී රෝහල් සම්පත් භාවිතා කරමින් ශල්‍යකර්ම සිදු කර තිබුණු අතර මෙම වෛද්‍යවරුන් විසින් 2021 වර්ෂය තුළදී රු.මිලියන 6.59 ක් වෘත්තීය ගාස්තු ලෙස රෝගීන්ගෙන් අයකර තිබුණි. එම මුදලින් රෝහල වෙත සියයට 0.15 ක සේවා ගාස්තුවක් පමණක් අයකර තිබුණි. වෛද්‍යවරු තිදෙනෙකු පෞද්ගලික සේවයේ යෙදීමට කළමනාකරණ මණ්ඩල අනුමැතියක් ලබා නොතිබුණු අතර වෛද්‍යවරුන් රෝහල තුළ පෞද්ගලික සේවයේ යෙදවීමට හා	වී. වෛද්‍ය ඩී. ඒ දිසානායක සහ වී. වෛද්‍ය කේ. ඒ සැල්වින් යන වී. වෛද්‍යවරුන් සඳහා ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල් අධ්‍යක්ෂ මණ්ඩලය මගින්ශල්‍යකර්ම සිදු කිරීම සඳහා අනුමැතිය ලබාදී ඇති. අනෙකුත්වී. වෛද්‍ය සම්බන්ධයෙන් ද අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර අවශ්‍ය කටයුතු සිදු කිරීමට පියවර ගනිමි.

		වෘත්තිය ගාස්තු අයකිරීමට අදාළ අනුමැතීන් විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. එම වෛද්‍යවරුන් සමඟ ගිවිසුමකට එළඹී නොතිබීම තුළ රෝගියාගේ වගකීම් රෝහලට පැවරෙන බව නිරීක්ෂණය විය.	
	vi.	විශේෂඥ වෛද්‍යවරුන් හා අනෙකුත් සහායක කාර්යමණ්ඩලය වෙත ආපසු ගෙවා තිබුණු වෘත්තිය ගාස්තු මත උපයනවිට ගෙවීම් බදු අයකර නොතිබුණු අතර 2014,2015 හා 2016 වර්ෂ සඳහා එසේ අඩුකර නොතිබුණු මුළු උපයනවිට ගෙවීම් බද්ද රු.මිලියන 108.52ක් විය.	මේ පිළිබඳව බදු අභියාචනා කොමිසමෙහි අභියාචනයක් විභාග වන අතර එහිදී ලබා දෙන තීරණය අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වෙමි.
	(ඇ)	2017 නොවැම්බර් 06 දින සේවයෙන් පහ කරන ලද හෘතික චිකිත්සකවරයෙකු 2018 අප්‍රේල් 11 දින රෝහලට එරෙහිව හෝමාගම කම්කරු විනිශ්චය සභාවේ නඩු පවරා තිබුණු අතර එම නිලධාරියා රෝහල විසින් අනුමත ලෙස සේවය අවසන් කර ඇති බවට කම්කරු විනිශ්චය සභාව තීරණය කර තිබුණි. ඒ අනුව අනුමත ලෙස සේවය අවසන් කර තිබූ වසර 4ක කාලපරිච්ඡේදය වෙනුවෙන් වැටුප් හා දීමනා ලෙස රු.මිලියන 2.77 ක් ගෙවීමට සහ නිලධාරියා නැවත සේවයේ පිහිටුවීමට රෝහලට සිදු වී තිබුණු අතර නීතිඥ ගාස්තු වෙනුවෙන් රු.64,000 ක් ඇතුළුව එකතුව රු.මිලියන 2.84 ක නිෂ්කාර්ය වියදමක් දැරීමට රෝහලට සිදු වී තිබුණි.	නිවාඩු රෝහල් කළමණාකරණය විසින් ගෙන තිබූ තීරණයක් මත කම්කරු විනිශ්චය සභාව විසින් මෙම තීන්දුව ගෙන ඇති අතර එම තීරණය අනුව කටයුතු කර ඇත.
	(ඉ)	රෝහලේ පරිගණක පද්ධති (Systolic- Acc Pack) සම්බන්ධයෙන් කරන ලද විගණන පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.	
	i.	මහාරෝගාශාලා මණ්ඩලයේ පවතින Systolic පරිගණක පද්ධතියේ Hospital Computer Module, Inventory Computer Moduleයන පද්ධතිදෙකෙහි තොරතුරුData Export කිරීමෙන් Accpack පරිගණක පද්ධතියට ඇතුළත් කිරීමෙන් පසු සිදුවන වෙනස්කම් නැවතAccpack පද්ධතිය තුළ (Update) යාවත්කාලීන නොකළ අවස්ථා නියැදි පරීක්ෂණයකදී අනාවරණය විය. මේ නිසා රෝහල් ගාස්තු ආපසු ගෙවීම්(refund), අවලංගු කරනු ලබන භාණ්ඩ ලැබීම් පත්‍ර(GRN) සහ අවලංගු කරනු ලබන රෝහල් ගාස්තු බිල්පත් වෙනුවෙන් නිකුත් කරන නව භාණ්ඩ ලැබීම් පත්‍ර හෝ නව රෝහල් ගාස්තු බිල්පත් ඇතුළත් කිරීමේදී තොරතුරු නිගමවරක් Accpack පරිගණක පද්ධතියට ඇතුළත්වීමේ අවදානමක් පවතින බවද	රෝහලේ Systolic සෞඛ්‍ය තොරතුරු පද්ධතිය (HIS) සිට Sage Accpacගිණුම්කරණ පද්ධතිය දක්වා දත්ත සම්ප්‍රේෂණ ක්‍රියාවලිය ස්වයංක්‍රීය කිරීම ආරම්භ කිරීමට,2022 අප්‍රේල් 5 වන දින රුපියල් 140000.00 ක මුදලකට Systolic සෞඛ්‍ය තොරතුරු පද්ධතියසංවර්ධන කණ්ඩායම සඳහා ප්‍රදානය කර ඇත. (ඇමුණුම 1,2). Sage Accpacමෘදුකාංග පාර්ශ්වයෙහි වෙනස් කිරීම සඳහා, ප්‍රධාන ගණකාධිකාරී, තොරතුරු තාක්ෂණ (IT) අංශයේ ප්‍රධානියා සහ රෝහල් පරිපාලනය නියෝජනය කරන කාර්ය මණ්ඩලය,Sage Accpacමෘදුකාංගයේ නියෝජිතයා සමඟ 2022 දෙසැම්බර් 14 වැනි දින ඍකවිඡා කළහ. (ඇමුණුම 3) Sage Accpac මෘදුකාංගයේ නියෝජිතයාට


		නිරීක්ෂණය විය. Accpack පරිගණක පද්ධතිය තුළ පවතින ගැනුම් පිරිවැය සහ ණයකිම්යෝ රු.මිලියන **4.75** කින්ද, ණයගැනියෝ සහ රෝහල් ගාස්තු ආදායම රු.මිලියන **1.84** කින්ද වැඩියෙන් දක්වා ඇති බව සිදු කළ නියැදි පරීක්ෂණයේදී අනාවරණය විය. රෝහලේ පවතින පරිගණක පද්ධති අතර අන්‍යොන්‍ය සම්බන්ධතාවයක් (System Link) ඇති කර නොතිබීම හේතුවෙන් මෙම පරිගණක පද්ධතිවල පවතින තොරතුරු සියල්ලම යාවත්කාලීන වීමAccpack පරිගණක පද්ධතියට ඇතුලත් නොවීම සහ පරිගණක පද්ධතියේ දත්ත ඇතුලත් කිරීම, පරීක්ෂා කිරීම හා අනුමත කිරීමට අදාල ක්‍රියාපටිපාටි නිසි අධිකාරී බලයක් යටතේ ක්‍රියාත්මක නොවීමත් එම ක්‍රියාවලිය පිළිබඳ අභ්‍යන්තර පාලනය ඉතා දුර්වල තත්වයක පැවතීම හේතුවෙන් වැරදි හා වංචා සිදුවීමේ ඉඩකඩක් පැවතිය හැකි බව වැඩි දුරටත් නිරීක්ෂණය විය.	අනුව, මෙම දත්ත සම්ප්‍රේෂණ ක්‍රියාවලිය ස්වයංක්‍රීය කළ හැකි වන්නේ Batch Process ආකාරයට වන අතරඑහි කාර්යක්ෂමතාවඉහල නැංවීම සඳහා දත්ත සම්ප්‍රේශන ක්‍රියාවලිය පැය එකකට වරක් කල හැකි බවද පවසන ලදී. (ඇමුණුම 4). කෙසේ නමුත්, එක් එක් ගනුදෙනුව එසැනින් සම්ප්‍රෙශනය කල නොහැකි බව දන්වන ලදී. නමුත් මෙම විසඳුම, මේ මොහොතේ වඩාත්ම කාර්යක්ෂම හා ගැලපෙන ක්‍රමය බැවින් රෝහල් පරිපාලනය විසින් අනුමත කරන ලද අතර, රෝහල් බිල්පතක් අවසන් කල පසු එයSystolic සෞඛ්‍ය තොරතුරු පද්ධතිය තුල කිසිදු වෙනස් කිරීමකට ලක් කල නොහැකි ලෙස සකස් කිරීමට උපදෙස් දෙන ලදී. මෙම ස්වයංක්‍රීයකරණ ක්‍රියාවලිය දැන් ආරම්භ කර ඇති අතර දැනට සැපයුම් අංශය විසින් අදාල කටයුතු සිදු කරගෙන යනු ලැබේ. (ඇමුණුම 5, 6) ඉහත කරුණු හැරුණු විට රෝහලේ සමස්ත සෞඛ්‍ය තොරතුරු පද්ධතිය පිළිබඳව අධ්‍යයනයක්සිදුකර නිර්දේශ ලබාදීම සඳහා තොරතුරු තාක්ෂණ (IT) උපදේශක නියෝජිතයකුගේ සහය ලබා ගැනීමට රෝහල් මණ්ඩලය තීරණය කර ඇත. (ඇමුණුම 7). මෙම ක්‍රියාවලිය දැන් තාක්ෂණික ඇගයීම් කමිටු මට්ටමේ පවතී. පරිගණක පද්ධති වල පවතින තොරතුරු සියල්ලම යාවත්කාලීන වීම Accpack පරිගණක පද්ධතියට ඇතුළත් නොවීම සහ පරිගණක පද්ධතියේ දත්ත ඇතුලත් කිරීම,පරීක්ෂා කිරීම හා අනුමත කිරීමට අදාල ක්‍රියාපටිපාටි සම්බන්ධයෙන් සහකාර ගණකාධිකාරිවරයෙකුට අධිකාරී බලය ලබාදීමට කටයුතු කර ඇත. ඊට අමතරව දිනපතා එදිනට පෙර මධ්‍යම රාත්‍රී වාර්තා (Mid Night Report) සම්බන්ධ හෙතික තොරතුරු, පරිගණක පද්ධතියේ තොරතුරු සමඟ ගැලපීමටද ඔහුට පවරා ඇත.
	ii.	Ward Register හි අදාල දිනට රෝහල් ගතවී සිටි රෝගීන් සම්බන්ධයෙන් (current) පරීක්ෂාවෙදී එදිනට රෝහලින් බැහැර වී ඇති එහෙත් බිල්පත් පියවී නොතිබුණු රෝගීන් **14**ක් රෝහල තුළ ඇතුළත් වී සිටින රෝගීන් ලෙස පරිගණක පද්ධතිය තුළ පෙන්නුම් කරන බවත් එම රෝගීන් **12** දෙනෙකු සඳහා	සඳහන් කර ඇති කරුණු සම්බන්ධයෙන් සොයා බැලීමට උපදෙස් ලබා දෙමි. ඊට වගකිවයුතු නිළධාරින්ගෙන් අදාල සිදුවීම් වලට හේතු වූ කරුණු විමසා බැලීමට කටයුතු කර මූල්‍යමය පාඩුවක් සිදුවී ඇති නම් අදාල නිළධාරින්ගෙන් අයකර ගැනීමට කටයුතු කරමි.

		ඇතුලත් වූ දින සිට විගණිත දිනය දක්වාම බිල්පත් සැකසෙමින් පැවති අතර අනෙක් රෝගීන් දෙදෙනා වෙනුවෙන් දින 329 ක් සහ දින 5ක් සඳහා එකතුව රු.මිලියන 23.98 ක බිල්පත් සකස්කර නිබුණි. මෙම ඇඳ ඉහපත් වාර්තාවන්ට අදාල රෝගීන් දැනට රෝහල්ගතව සිටින රෝගියෙකු ලෙස පරිගණක පද්ධතිය තුළ නිරූපනය වීමට හේතුවූ කරුණු විගණනයට අනාවරණය නොවුණි. වර්ෂ 1සිට 7 අතර කාලයක් තිස්සේ පැවත එන මෙම බිල් පත් ශේෂ හඳුනාගෙන එම ශේෂ නිරවුල් කර ගැනීමට විගණිත දිනය වන 2022 අගෝස්තු 26 දින වන විටත් කටයුතු කර නොනිබුණි.	
	iii.	රෝහලේ පරිගණක පද්ධතියෙහි (Systolic - Hospital) Ward Register හි Bill Finalized යන අයිතමය පරීක්ෂා කිරීමේදී රෝගී වාට්ටු 5 කට අදාලව රෝගීන්ගේ අවසන් බිල්පත සකසා එම රෝගීන් රෝහලෙන් පිටව ගොස් නිබුණද, පරිගණක පද්ධතිය තුළ තව දුරටත් රෝගීන් ලෙස පෙන්නුම් කරන රෝගීන් 16 දෙනෙකු සිටින බව නිරීක්ෂණය විය. ඉන් රෝගීන් 5 දෙනෙකු ගෙවිය යුතු බිල්පත් වලින් කොටසක් පියවා රෝහලෙන් පිටව ගොස් නිබුණු අතර ලැබිය යුතු මුදල් රු.67,195 ක් පරිගණක පද්ධතියේ ලැබිය යුතු අගයක් ලෙස දක්වා නොනිබුණි.කෙසේ වුවද රෝගීන් විසින් සම්පූර්ණ බිල්පත් නොපියවා රෝහලෙන් පිටව යාමට අවසර දීම විගණනයේදී මතභේදාත්මක කරුණක් විය.	සඳහන් කර ඇති කරුණු සම්බන්ධයෙන් සොයා බැලීමට උපදෙස් ලබා දෙමි. ඊට වගකිවයුතු නිළධාරින්ගෙන් අදාල සිදුවීම් වලට හේතු වූ කරුණු විමසා බැලීමට කටයුතු කර මූල්‍යමය පාඩුවක් සිදුවී ඇති නම් අදාල නිළධාරින්ගෙන් අයකර ගැනීමට කටයුතු කරමි.
	iv.	මූල්‍ය ප්‍රකාශන සැකසීම සඳහා අවශ්‍ය දත්ත ලබා ගැනීමෙන් පසුව පද්ධතියේ ඇතුළත් වාර්තා වෙනස් කිරීමට ඇති පහසුකම අහුරා තැබිය යුතු වුවද එසේ සිදුකර නොනිබුණි.	රෝහල් බිල්පත් පිළියල කල අවසන් කල පසු එය Systolic පද්ධතිය තුල කිසිදු වෙනස් කිරීමකට ලක් කල නොහැකි ලෙස ඒ අවස්ථාවේම අහුරා තැබීමට මේ වන විට කටයුතු යොදා ඇත. ඒ අනුව මූල්‍ය ප්‍රකාශන සැකසීම සඳහා අවශ්‍ය දත්ත ලබා ගැනීමෙන් පසුව පද්ධතියේ ඇතුලත් වාර්තා වෙනස් කිරීමට ඉඩ ලබා නොදේ.
	(ඊ)	මහාරෝග්‍යාගාලා මණ්ඩලය විසින් හැටන් නැෂනල් බැංකුව හා මහජන බැංකුව යන ආයතන වෙත තම ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමට කුලී පදනම් මත රෝහල් පරිශ්‍රයන් ඉඩකඩ වෙන්කර දී නිබුණද රෝහල සහ එම ආයතන අතර බදු කුලී ගිවිසුමක් ඇති කර ගෙන නිබුණු බව නහවුරු නොකෙරුණි.	මෙම බදු කුලී ගිවිසුම් යාවත්කාලීන කිරීමට අදාල කටයුතු ආරම්භ කර ඇති අතර හැකි ඉක්මනට නව ගිවිසුම් වලට එලඹීමට කටයුතු කරමි.

	(c)	සමාලෝචිත වර්ෂයේ සිදු කරන ලද රසායනාගාර පරීක්ෂණ සම්බන්ධයෙන් කරන ලද පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය.	
	i.	ආයතනය විසින් Hematology සහ Bio Chemistry අංශ මඟින් සිදු කර ඇති රාත්‍රී රසායනාගාර පරීක්ෂාවන් සම්බන්ධයෙන් පවත්වාගෙන යන ලේඛණයට අනුව රාත්‍රී කාලයේ සිදු කරන ලද පරීක්ෂණ ප්‍රමාණය සහ පරිගණක පද්ධතියෙහි පවතින රාත්‍රී සාම්පල ලබා ගැනීමේ වාර්තාවෙහි (sample acceptance report) සඳහන් පරීක්ෂණ ප්‍රමාණය සමඟ සැසඳීමක් සිදු කර නොතිබුණි. 2021 ජනවාරි මස සිට දෙසැම්බර් මාසය දක්වා වූ කාල පරිච්ඡේදයට අදාලව රාත්‍රී කාලයේදී සිදු කරන ලද සියලුම පරීක්ෂණ සම්බන්ධයෙන් සිදු කරන ලද පරීක්ෂාවේදී Hematology අංශය විසින් ඉදිරිපත් කරන ලද ලේඛනවල ඇතුලත් පරීක්ෂණ සංඛ්‍යාවට වඩා පරිගණක ගත කර තිබූ පරීක්ෂණ සංඛ්‍යාව 15,556 කින් අඩු වී තිබූ අතර Bio Chemistry අංශය විසින් ඉදිරිපත් කර තිබූ ලේඛනවල ඇතුලත් පරීක්ෂණ සංඛ්‍යාවට වඩා පරිගණක ගත කර තිබූ පරීක්ෂණ සංඛ්‍යාව 40,059 කින් වැඩි වී තිබූ බව නිරීක්ෂණය විය. එසේ වෙනස්කම් ඇති වීමට හේතු සොයා බලා නිවැරදි කිරීමට අදාල අංශ විසින් කටයුතු කර නොතිබුණි.	රාත්‍රියට සිදු කරනු ලබන Haematology හා Biochemistry අංශ වල වෙන වෙනම පවත්වා ගනු ලබන රාත්‍රී ලේඛනය සත්‍ය වශයෙන්ම සිදු කරනු ලැබූ පරීක්ෂණ වලට අදාළ වර්තාය. ඒවා නිවැරදි වේ. එම වාර්තා හා එම දිනයන්ට අදාල test request forms සැසඳීම මඟින් ඔබට එය තහවුරු කර ගැත හැකිය. රාත්‍රී කාලයේදී හා දිවා කාලයේදී සිදු කරන පරීක්ෂන සඳහා පරිසනක ගත තොරතුරු හා ඉදිරිපත් කරනු ලබූ ලේඛන වල තොරතුරු අතර මීට ඉහතදීත් වෙනස්කම් පවතින බව නිරීක්ෂණය වී ඇත.එම නිරීක්ෂණ මීට ඉහත විගණන වීමසුම් සඳහා ද ඉදිරිපත් කර ඇති අතර එය සෑම විටකම එකම අගයක් නොවීම කෙරෙහි විවිධ ප්‍රයෝගික හේතූන් බලපායි. රාත්‍රී සේවා මුර සඳහා දැනට සවස 3.00 හා උදැසන 7.00 අතර “accept” කරන සම්පල පමණක් යොදා ගන්නා අතර මෙවැනි වෙනස් කම් හැකි තරම් අවම කිරීමට අවශ්‍ය වන සාධනීය සාකච්ඡා නවදුරටත් සිදු කිරීමේ අවශ්‍යතාවය මෙයින් දන්වා සිටිමු.ඒ සඳහා තව දුරටත් පරිගණක පද්ධතියේ sample acceptance report එකට ඇතුලත් නොවන පරීක්ෂණ හඳුනාගෙන ඒවා නිසි පරිදි සටහන් වන ක්‍රමයක් සැකසිය යුතුව ඇත. sample acceptance report එකට ඇතුලත් නොවන පරීක්ෂණ සඳහා පරීක්ෂණ වාර්තා, පද්ධතිය මඟින්ම සලකුණු කර ඒවායේ වාර්තා නිකුත් නොකර MLT වරයාට දැක්වෙන පරිදි ක්‍රමයක් සැකසීමට යෝජනා වී ඇති අතර එමඟින් sample acceptance report එකට ඇතුල් නොවන සාම්පල් වලක්වාගත හැකිය.
	ii.	Hematology සහ Bio Chemistry අංශය විසින් 2021 වර්ෂය තුළ රාත්‍රී සහ දහවල් කාලයේ සිදු කරන ලද පරීක්ෂණ සඳහා පරිගණක පද්ධතිය වෙත ඇතුළත් කර තිබුණු නියැදි ප්‍රමාණය (sample acceptance report) එකතුව 505,064 ක් විය. ඒ අනුව	දහවල් සේවා මුර වලදී විශේෂ පරීක්ෂණ රැසක් සිදු කරන අතර ඒවා රාත්‍රී සේවා මුර සඳහා අදාළ නොවේ.එබැවින් රාත්‍රී කාලයේදී එක් නිලධාරියෙකු සිදු කරන සේවාව දහවල් කාලය සමඟ සැසඳීමක් සිදුකල නොහැක. උදාහරණ (Flowcytometry, Bone marrow tests,

		දහවල් කාලයේදී Hematology පරීක්ෂණාගාර සඳහා රසායනාගාර තාක්ෂණික ශිල්පීන් 7ක් හා Bio Chemistry පරීක්ෂණාගාර සඳහා රසායනාගාර තාක්ෂණික ශිල්පීන් 8ක් සේවයේ යෙදෙන නමුත් රාත්‍රී සේවය සඳහා එක් අංශයකට එක් රසායනාගාර තාක්ෂණික ශිල්පියෙකු පමණක් සේවයේ යොදවනු ලැබේ. මෙම අංශ දෙකෙහිම රසායනාගාර තාක්ෂණික ශිල්පීන් 15ක් විසින් 2021 වර්ෂය තුළ දහවල් කාලයේ සිදු කරන ලද නියැදි පරීක්ෂණ සංඛ්‍යාව 239,819 ක් වූ අතර රසායනාගාර තාක්ෂණික ශිල්පීන් දෙදෙනෙකු විසින් රාත්‍රී කාලයේ නියැදි පරීක්ෂණ 265,245 ක් සිදු කර ඇති බව අනාවරණය විය. මේ අනුව එක් එක් අංශ විසින් දිවා කාලයේ සිදු කරනු ලබන පරීක්ෂණ සංඛ්‍යාවට වඩා වැඩි පරීක්ෂණ සංඛ්‍යාවක් එක් නිලධාරියෙකු විසින් රාත්‍ර28 කාලයේ සිදුකර තිබුණු බව නිරීක්ෂණය විය.	special coagulation tests, factor assays, LA1/LA2, inhibitor detection, factor correction studies, clot solubility tests, platelet aggregation studies, G6PD test, Ham test, Osmotic fragility test, PCR , Hormone assays, Cancer antigen assays, sudan black B, iron stain, reticulocyte counts, NAP score, other biochemical profile tests). මීට අමතරව දහවල් කාලයේදී සියලුම පරීක්ෂණ යන්ත්‍ර වලට අදාළ "Internal and External quality controls" සිදු කිරීමද සිදුවේ. උදාහරණයක් ලෙස Haematologyඅංශය ගත් විට එහි සිටින වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ වරුන් එම අංශයේ ඒ ඒ පරීක්ෂණ හා පරීක්ෂණ යන්ත්‍ර සඳහා වෙන වෙනම ක්‍රියා කරනු ලබයි. උදාහරණයක් ලෙස එදා දිනයට blood picture පරීක්ෂණ සිදු කරන නිලධාරියා එම ස්ථානයේම දිගින් දිගටම රැඳී සිටීම අනිවාර්ය වන අතර FBC පරීක්ෂණ වලදී abnormal counts, manual counts ආදිය සඳහා ද ලේ පින්තූර පිළියෙළ කිරීම සිදු කල යුතු වේ.එමෙන්ම ඇට මිදුළු පරීක්ෂණ සඳහා සහභාගී වීම, ඇට මිදුළු aspiration biopsy slides පිළියෙළ කිරීම, ඇට මිදුළු සඳහා special stains පිළියෙළ කිරීම හා සිදු කිරීම සිදු කල යුතු වේ. ඒ ආකාරයෙන්ම එදිනට flowcytometry පරීක්ෂණ සිදු කරන නිලධාරියාද අදාල යන්ත්‍රයේ settings සැකසීම, calibration සිදු කිරීම ආදිය සිදු කර පැමිණෙන ලේ පිළිකා සාම්පල සඳහා special stain යෙදීම හා එම සාම්පල යන්ත්‍රය වෙත යොමු කිරීමට සැකසීම ආදිය සිදු කල යුතුය. එමෙන්ම coagulation studies සිදු කරන නිලධාරියාද රාත්‍රී කාලයේදී සිදු නොකරනු ලබන factorstudies,lupus anticoagulatant ,mixing studies යනාදිය සිදු කල යුතුව ඇත. රාත්‍රී කාලයේදී සිදු නොකරනු ලබන HbA1C පරීක්ෂණද දහවල් කාලයේදී ඉතා වැඩි වශයෙන් සිදු කරනු ලබන පරීක්ෂණයකි. ඒ සඳහා මෙන්ම සෑම සිකුරාදා දිනයකදීම HPL C පරීක්ෂණය සිදු

			කිරීමටද එම නිලධාරියාට සිදුවේ. එමෙන්ම රාත්‍රී රාජකාරි වලදී සිදු නොකරනු ලබන Osmotic fragility tests,cryohaemolysis tests, brewer's tests,LEcells,Hams Tests, sickling tests , body fluid tests ආදියද දහවල් කාලයේදී කිරීමට සිදුවේ. එමෙන්ම histopathology අංශයේ සහ microbiology අංශයේ කරනු ලබන සියළුම පරීක්ෂණ කිසිවක් රාත්‍රී කාලයේ සිදු නොකරන අතර සියළුම විශේෂ පරීක්ෂණයන් සිදු කරනු ලබන්නේ දහවල් කාලයේදී පමණි. මෙම විශේෂ පරීක්ෂණයන් සඳහා වෙන වෙනම වෛද්‍ය පරීක්ෂණ කාර්මික විද්‍යාඥයන් යොදවනු ලබන අතර සාමාන්‍ය පරීක්ෂණ සඳහා මොවුන් යෙදවීම සිදු කල නොහැක. (උදා. මූත්‍රා ඇතුළු සියළුම culture පරීක්ෂණ, biopsy cutting,embedding,staining සහ cytology පරීක්ෂණ යන්ත්‍ර භාවිතයෙන් කොරව manual ලෙස සිදු කිරීම) ඒ ආකාරයෙන්ම අනෙක් යන්ත්‍ර (දහවල් කාලයේදී විශේෂ පරීක්ෂණ සිදු කරන Biochemistry අංශයේ ඇති යන්ත්‍ර) ආශ්‍රිතව සිදු කරන පරීක්ෂණ ආදියේද QC, Calibration, test validation ආදී රාත්‍රී රසායනාගාරයේ සිදු නොකරනු ලබන බොහොමයක් කාර්යයන් සිදු කරනු ලබයි. එබැවින් රාත්‍රී සේවා මූර හා දහවල් සේවා මූර සංඛ්‍යාත්මක වශයෙන් සැසඳීමක් සිදු කල නොහැක.
	ඌ.	මහාරෝග්‍යශාලා මණ්ඩලය පිහිටි පරිශ්‍රෙය් ප්‍රධාන සැලැස්ම (Master Plan) පිළියෙල කිරීම සඳහා උපදේශක ගාස්තු වශයෙන් මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශයට රු.508,950 ක් 2017 වර්ෂයේ දී ගෙවා නිබුණු අතර 2021 දෙසැම්බර් 31 දින වන විටත් එම කාර්යය සම්පූර්ණ කරවා ගෙන නොනිබුණි.	CECB ආයතනය මඟින් ඉංජිනේරු මිණුම් සැලසුම් පත් මෙවන විට සම්පූර්ණ කර ඇත. එම කටයුතු රටේ පැවති කොවිඩ් වසංගත වාතාවරණය මත කල් ගොස් ඇත. COPE කමිටු නිර්දේශය මත Cooperate plan සකස් කිරීමෙන් පසුව එහි ඉතිරි කටයුතු අවසන් වනු ඇත. ඉදිරියේදී රෝහල් පරිශ්‍රෙය් ප්‍රධාන සැලැස්ම පිළියල කිරීමට අවශ්‍ය පියවර ගනිමි.
	එ.	සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ 04ක රෝහලේ සමස්ත කාර්ය සාධනය පහත පරිදි වේ.	

			
		පහත කරුණු නිරීක්ෂණය විය.	
	i.	2018 වර්ෂයට සාපේක්ෂව 2021 වර්ෂයේ රෝහලේ ඇඳන් සංඛ්‍යාව සියයට 6 කින් හා ඇඳන් භාවිතය සියයට 12 කින් අඩු වීමක් නිරීක්ෂණය විය.	විගණන නිරීක්ෂණය මඟින් දක්වා ඇති ආකාරයට රෝහලෙහි මුළු ඇඳන් සංඛ්‍යාව 2018 වර්ෂයට සාපේක්ෂව 2021 වර්ෂයේ 6% කින් අඩු වී ඇති බව නිවැරදිය. 2021 වර්ෂයේ රට තුල පැවති කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් රෝහල් ක්‍රියාකාරිත්වය පසුගිය වර්ෂවලදී මෙන් සාමාන්‍ය තත්වයෙන් පවත්වාගෙනයාමට නොහැකි විය. මේ නිසා රෝගීන් අතර දුරස්ථභාවය ආරක්ෂා කිරීම පිණිස ඇඳන් අතර පරතරය වැඩිකිරීමට සිදුවිය. එබැවින් සාමාන්‍ය තත්වය යටතේ රෝහල තුල පවත්වාගෙන යන ලද ඇඳන් සංඛ්‍යාව ඒ අයුරින්ම පවත්වා ගැනීමට නොහැකි වූ අතර 2018 වර්ෂයට සාපේක්ෂව 2021 වර්ෂයේ 6% ක ඇඳන් සංඛ්‍යාවේ අඩුවීමට මෙම තත්වය හේතුවී ඇත.
	ii.	2018 වර්ෂයට සාපේක්ෂව 2021 වර්ෂයේදී රෝහලට රෝගීන් ඇතුළත් වීම සියයට 32කින් හා සායන සඳහා පැමිණීම සියයට 25කින් අඩු වී තිබුණි.	2018 වර්ෂයට සාපේක්ෂව 2021 වර්ෂයේ දී රෝහලට රෝගීන් ඇතුලත් වීම 32%කින් හා සායන සඳහා පැමිණීම 25%කින් අඩුවී ඇති බව නිවැරදිය. 2021 වර්ෂයේ රට තුල පැවති කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් රෝහල වෙත පැමිණුන රෝගීන්ගේ ප්‍රබල අඩුවක් පැවතින. රට තුල සංචරන සීමා පැවතීම ඉතා අත්‍යාවශ්‍ය කරුණකදී හැර ජනතාව රෝහල් කරා නොපැමිණීම වැනි හේතූන් මත ඇතුලත් වූ රෝගීන්ගේ හා සායනික රෝගීන්ගේ අඩුවීම් සිදුවී ඇත.

	iii.	රෝහල විසින් කරනු ලබන පරීක්ෂණ හා ශල්‍යකර්මවල ප්‍රගතියේ පහළ යාමක් නිරීක්ෂණය වූ අතර එය 2018 වර්ෂයට සාපේක්ෂව 2021 වර්ෂයේදී පරීක්ෂණ 269,426 ක අඩු වීමක් නිරීක්ෂණය විය.	විගණන විමසුමේ යඳහන් සිදුකර ඇති විවිධ පරීක්ෂණ හා ශල්‍යකර්ම සංඛ්‍යාව 2018 වර්ෂයේ 1,522,335 සිට 2019 වන විට 1,678,874 දක්වා 156,539 කින් 10%කින් වැඩි වී ඇත. නමුත් වර්ෂ 2020 සහ 2021 යන වර්ෂයන්හි 1,256,986 සහ 1,252,909 වශයෙන් පරීක්ෂණ හා ශල්‍යකර්ම ප්‍රමාණය ද අඩුවීමය. ඒ අනුව විගණන විමසුමෙහි යඳහන් ආකාරයට ''දිගින් දිගටම පරීක්ෂණ හා ශල්‍යකර්ම ප්‍රමාණය අඩුවී ඇත.'' යන්න නිවැරදි නොවන අතර වර්ෂ 2018 ට සාපේක්ෂව 2019 වැඩිවී ඇති අතර කොවිඩ් 19 වසංගතය ආරම්භ වීමෙන් පසු 2020 වර්ෂයන්හි අඩුවීම සිදුව ඇත.

6. ඉදිරි දැක්ම





6.1 ආයතනයේ කාර්යසාධන වර්ධනය සඳහා අපේක්ෂිත මධ්‍යම කාලීන ක්‍රියාකාරකම්

අරමුණු	ක්‍රියාකාරකම්
නව ගොඩනැගිලි ඉදිකිරීම්	♦ පරිපාලන ගොඩනැගිල්ල සඳහා ඊඑල්යූ (ELU) පද්ධතියක් සමඟින් (ගැහැණු සහ පිරිමි හෙද නිල නිවාස, පරිපාලන ගොඩනැගිල්ල සහ කම්හල) ඇතුළාන්ත වැඩ සහ ගෘහභාණ්ඩ සැපයීම
පවත්නා යටිතල ව්‍යූහය පුනරුත්ථාපනය	♦ ඉදිකිරීම් උත්පාදක කාමරය, නව ට්‍රාන්ස්ෆෝමර් සහ ජනක යන්ත්‍ර මිලදී ගැනීම ඇතුළුව බල සැපයුම වැඩිදියුණු කිරීම සහ පුළුල් කිරීම ♦ උරස් කන්තුක ශල්‍යාගාරය සඳහා මළනොකන වානේ දොරවල් ♦ වාට්ටුවල අනෙකුත් පුනරුත්ථාපන කටයුතු හා වැඩිදියුණු කිරීම් මෘදුකාංග වෙබ් අඩවියේ වෛද්‍ය වාර්තාව
උපකරණ සම්පාදනය	. ♦ වෙනත් වෛද්‍ය, ශල්‍ය සාමාන්‍ය උපකරණ සහ උපකරණ මිලදී ගැනීම (කන්තුක කැතීටරකරණ රසායනාගාරය ඇතුළුව)